ස යු රෙ න්

# එතෙර

එතෙර ශ්‍රමයට මෙතෙර උපහාරය

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී.
1 වන කාණ්ඩය 4 වන කලාපය
2020 නොවැම්බර්



ස යු රේ න්
# එතෙර
එතෙර ශ්‍රමයට මෙතෙර උපහාරය.

අංක 450, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.
දුරකථන : +94 11 2689500-508 ෆැක්ස් : +94 11 2689510/2674347
ඊ මේල් : csl123@sltnet.lk අන්තර්ජාලය : www. ceylonshippinlines.com

# දරු උපතක අසිරිය

**පුරාණ කාලයේ දරු උපත යනු සිරිත් විරිත් චාරිත්‍ර රැසක් සිදුවන අවස්ථාවකි. එය අද මෙන් සරල ක්‍රම වේදයක් නොවේ. දරු උපත සඳහා අද වෛද්‍යවරයාගේ රාජකාරිය එදා කළේ දායම්මා හෙවත් වින්නඹු අම්මායි. ඒ සඳහා පළපුරුදු කාන්තාවන් ගම් වල සිටියහ. සූතිකාගාරය වෙනුවට එදා තිබුණේ තිඹිරි ගෙයයි. බොහෝ ගෙවල් වල ඒ සඳහා වෙනම කාමරයක් පැවතුනි.**



දරු උපතින් පසු ගැහැණු ද පිරිමි ද කියා දායම්මා ගෘහාධිපතිට දන්වන්නේ පිරිමි දරුවෙක් නම් "සරමක්" යනුවෙනි. ගැහැණු දරුවෙක් නම් "කම්බායක්" යනුවෙන් පවසයි. දරුවා හඩන ශබ්දයත් සමඟ දරුවාගේ පියා දහවල් කාලයේ නම් පියවර මැන ඒ පියවර ගාන මතක තබා ගනියි. සඳ ඇති රැයක් නම් සඳ එළියෙන් පියවර මනිනු ලබයි. සඳ එළිය නැති විට කෙසෙල් ගසකට කොටයි. එහි මධ්‍ය බොඩය ඇදුනු අගල් ගණන දෛවඥයාට පවසනු ලැබීමෙන් පසු ඔහු වේලාපත්කඩය සාදයි.

දරුවා හඩනු ඇසූ ගමන් ගෙහිමියා මෝල්ග සක් ගෙන එයින් වහළයට තෙවරක් ගසා මෝලගස වහලයට උඩින් විසි කරනු ලබයි. එයින් දරුවා වීරයෙකු වන බව ගැමියාගේ විශ්වාසයයි.

දරුවා හැඩූ පසු දරුවාගේ පෙකණි වැල කපයි. ඉන්පසු දරුවා පිරිසිදු කොට එළියට ගෙන පහණක් දල්වා එය පෙන්වීමට කටයුතු කරයි. ඊළඟට සිදුවන්නේ රන්කිරි කට ගෑමයි. තනකිරි ස්වල්පයක් පීරිසියට ගෙන එයට රන් මුද්දක් හෝ රන් ආභරණයක් දමයි. බත් ඇටයක් හා හාල් ඇටයක්ද එයට එක් කරයි. අනතුරුව ඇඟිල්ලෙන් හෝ රන් ආභරණයෙන් හෝ පහන් තිරයකින් දරුවාගේ කටේ කිරි ස්වල්පයක් ගායි. එය සිදු කරන්නේ දරුවාගේ පියාය. පියා නැති විට මවගේ පියා හෝ මව හෝ පියාගේ මව හෝ පියා හෝ අතින් එය සිදුවෙයි.

අනතුරුව පිත්තල සෙම්බුවක් ගෙන දරුවාගේ කණට ලංකර ගිරයකින් එයට තෙවිටක් ගසයි. එය වින්නඹු මාතාව විසින් සිදුකරයි. ඒ ගසන විට "ආ හබහයි ගොළු දෙබහයි" යනුවෙන් ශබ්ද නගා කියයි.

දරුවාගේ හැඩීමත් සමඟ මව ගේ කෙළිදිරිය නවතී. එවිට මවගේ මව රන් මුදුවක් සමඟ තිඹිරි ගෙට ඇතුළු වෙයි. හැන්දකට මවගෙන් කිරි ස්වල්පයක් දොවා මුදුව උරච්චි කර රත්‍රං මිශ්‍රිත කිරි ස්වල්පයක් දරුවාගේ කටේ ගායි. තවත් තැන් වල පොල්කිරි සීනි සමඟ මිශ්‍ර කර රත්‍රං ස්වල්පයක් උරච්චි කර එම කිරි ස්වල්පය දරුවාගේ කටේ ගායි. මෙම රන්කිරි කට ගෑම යනුවෙන් හඳුන්වයි.

## දොරට වැඩුම

දරුවා ඉපදී දින 7 ක් හෝ 9 න් මෙම චාරිත්‍රය සිදු කරයි. ඒ සඳහා දායම්මා පැමිණෙයි. මෙදිනට යෙදෙන සුබ නැකතින් දරුවා රෙදි කඩකින් ඔතා හිරු එළියට දරුවා රැගෙන යයි. මිදුලේ සිට ගේ දෙස බලගෙන දායම්මා "කොටෝ කොටෝ කොට ගැරඩියෝ - තොටත් නැතෝ මටත් නැතෝ" කියමින් දරුවා ආච්චි අම්මා අතට දෙයි.

මෙදිනට කැවුම් කිරිබත් ඇතුළු තේ මේසයක් ද පිළියෙල වෙනු ඇත.

දරුවා නිරෝගි නම් එළඹෙන පසළොස්වක පොහොය දිනට දරුවාත් පවුලේ උදවියත් දායම්මාත් ඇතුළු පිරිස පංසලට යති. ආගමික වතාවත් සිදුකොට භාරහාරාදිය ඔප්පු කිරීම සිදුවෙයි.

## ඉඳුල් කටගෑම

දරුවා පළමුවෙන් මව්කිරි අනුභවයට අමතරව වෙනත් ආහාර ගැනීම සිදු කිරීම අරඹන්නේ සුබ නැකතිනි. ඒ සඳහා පිරිමි දරුවෙකු නම් ඉපදී 6,8,10,12 යන මාසවලත් ගැහැනු දරුවෙකු නම් ඉපදී 7,9,11 යන මාසවලත් සිදුවෙයි. ඒ සඳහා සුබ නැකතක් යොදා ගනියි. මෙය සමහර තැන්වල මහත් උත්සවයක් ලෙසින් සිදුවෙයි. ඉදුල් කටගෑමට ප්‍රථම කළුකුමාර පිදිල්ලක් ද සමහර ප්‍රදේශවල සිදුවෙයි.

## නම් තැබීම

දරුවා ඉපදීමෙන් පසු ඔහුට හෝ ඇයට සුදුසු නමක් තැබීමත් සිදුවනවා. ඒ සඳහා දරුවාගේ උපන් වෙලාව අනුව වේලපත්කඩය සාදා ලග්නයට, දිනයට, නැකතට අනුව සුදුසු අක්ෂරයක් යොදා ගනියි. ඒ අනුව ගණ හා යෝනි අනුව සුදුසු නම තෝරයි. දේව, චන්ද්‍ර ජල භූමි යන ගණවලින් නම තැබීම සුබයි.

දරු උපතකින් පසු සිදුවන තවත් කටයුත්තක් හිසකෙස් කැපීම දරුවා ඉපදී දින 45 න් කෙස් රොදක් කපා ගලන දිය පහරකට දමයි. ගලන ගඟක් සේ කෙස් ඇදේවා යන්න ප්‍රාර්ථනයයි. දින 45 න් කැපීමට නොහැකි වුවහොත් දරුවා හොඳින් කතා බස් කරන තෙක් වසර තුනක් පමණ බලා සිටිය යුතුය.

ගැහැණු දරුවන්ගේ කන් විදීමද සිදුවන්නකි. මේ සඳහා සුදුසු නැකතක් අනුව ඒ වේලාවට සිදුවෙයි. සුබ නැකතට කන් විදීමෙන් පසු පවුලේ වැඩිහිටි කාන්තාව විසින් දරුවාගේ කණට කරාබුවක් දමයි. සෙසු අය තෑගි බෝග ලබා දෙයි.

## බාලගිරි දෝෂය

අලුත උපන් දරුවාට ඇති වන දෝෂයකි බාලගිරි දෝෂය. දරුවා නිතර හැඩීම සිදුවන විට එය බාලගිරි දෝෂය ලෙස ගම්මු හඳුන්වයි. බාලගිරි නම් යක්ෂයා වෙසමුණි රජුගෙන් වරම් ගෙන කුඩා දරුවන්ට වින කරන බව පැරැන්නන්ගේ විශ්වාසයයි. මේ සඳහා ගම්මු විවිධ දෑ කරති. නයි හැව, එළු ලොම් බළල් වසුරු, දුම්මල, මුරුව, කොහොඹ යනාදිය දමා දුම් ඇල්ලීම සිදු කරයි. තවද වදින පුදන බෝධියකින් කොළ 9 ක් හෝ 11 ක් ගෙන සාම්බ්‍රාණි සමඟ ගිනි කබලක දමා දුම් අල්ලති. එමගින්ද මෙම දෝෂය දුරුවන බව කියයි.

බාලගිරි යකු නේ
බිළිඳුට දොස් කරන්නේ
දැළි අඟුරු ගන්නේ
අද නොවෙයි නුඹ හෙට වරෙන්නේ

නිවසේ හෝ දරුවා සිටින කාමරයේ හෝ උළුවස්ස උඩ මෙසේ ලියයි. "බාලගිරි අද නොවෙයි හෙට වරෙන්" යනුවෙන් ද ලියනු ලබයි.

බාලගිරි යක්ෂයා දරුවාට හදි කිරීමට පැමිණෙන විට මෙම වැකිය දැකීමෙන් "හෙට" එන බව සිතා ආපසු යයි. පසුදාත් පැමිණෙන මෙම යක්ෂයා එම වැකිය නැවත දකියි. නැවතත් ආපසු යයි. මෙලෙස බොහෝ කාලයක් පැමිණි පසු වෙහෙසට පත් වන බාලගිරි යකු නැවිදින් සිටියි.

ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට

# පිටරට සිට එවන මුදල් ලබාගන්නා ඔබ සඳහාම
# විශේෂිත රෙමිටන්ස් කාඩ්පතක්




## ඔබේ රෙමිටන්ස් කාඩ්පත අදම ලබාගෙන මෙම සියලු වාසි අත්විඳින්න.

- ආරම්භක ගාස්තු නොමැතිව නොමිලේ කාඩ්පතක් ලැබීම.
- පිටරට සිට ලැබෙන මුදල් එසැණින් ඔබගේ ගිණුමට ලැබීම.
- දවසේ ඕනෑම වේලාවක මුදල් ලබාගැනීමට දිවයින පුරා විහිදුනු ATM ජාලය.
- විවිධ භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට Debit Card පතක් ලෙසින්ද ශ්‍රී ලංකාවේ සහ පිටරට දී භාවිතා කිරීමේ හැකියාව.
- කාඩ්පත් හිමියන් සඳහා වසර පුරා හිමිවන සුවිශේෂී වට්ටම් හා දීමනා.
- පිටරට සිට එවන මුදල් ලබාගන්නන් හට ලබාදෙන සුවිශේෂී 'එහ@සි ණය' පහසුකම.
- බැංකුව මගින් පවත්වන ප්‍රවර්ධන වැඩසටහන් වලදී වැඩි දිනුම් අවස්ථා හිමිවීම.
- බැංකුවේ සුවිශේෂී ගණුදෙනුකරුවන් හට හිමිවන වරප්‍රසාද වැඩසටහන් සඳහා සුදුසුකම් ලැබීම.

කොමර්ෂල් බැංකුවේ **e-Exchange,** වෙලාවට පරිස්සමට පිටරට සිට මුදල්

100 YEARS

COMMERCIAL BANK

*කොන්දේසි සහිතයි | Fitch Rating AA (lka) | +94 112 353 576 | www.combank.lk

ඔබේ ජය අපේ පැතුමයි

# මුඛ ආවරණයක්

## පළඳින්නේ සහ භාවිතා කරන්නේ කෙසේද?



මුඛ ආවරණයක් පැළඳීමට පෙර දෑත් සබන් සහ ජලයෙන් හෝ මධ්‍යසාර අඩංගු විෂබීජ නාශක ද්‍රාවණයකින් සෝදන්න



මුඛය, නාසය සහ නිකට හොඳින් ආවරණය කර ගන්න. මුහුණ සහ ආවරණය අතර කිසිදු පරතරයක් නැතිවන ලෙස පැලඳීමට වග බලාගන්න



ආවරණය පැදගෙන සිටින විට එය ඇල්ලීමෙන් වලකින්න. ඔබ අතින් ආවරණය ඇල්ලු විට, දෑත් සබන් සහ ජලයෙන් හෝ මධ්‍යසාර අඩංගු විෂබීජ නාශක ද්‍රාවණයකින් සෝදන්න

# මුඛ ආවරණයක්

## ඉවත් කරන්නේ කෙසේද?



එක්වරක් පමණක් භාවිතා කර ඉවත දමන මුඛ ආවරණයක් භාවිතා කරන්නේ නම් එය තෙත් වූ වහාම අලුත් මුඛ ආවරණයක් පැළඳිය යුතු අතර එවැනි මුඛ ආවරණය නැවත නැවත භාවිතා නොකළ යුතුය



මුඛ ආවරණය ගලවන විට පිටුපසින් අල්ලා ගැලවිය යුතුය. (මුඛ ආවරණයේ ඉදිරි පස ස්පර්ශ නොකළ යුතුය)



එක්වරක් පමණක් භාවිතා කරන මුඛ ආවරණයක් භාවිතා කළ වහාම වැසිය හැකි කසළ බඳුනකට ඉවත් කරන්න. අනතුරුව දෑත් සබන් සහ ජලයෙන් හෝ මධ්‍යසාර අඩංගු විෂබීජ නාශක ද්‍රාවණයකින් සෝදන්න




රෙදි වලින් සැකසූ මුඛ ආවරණයක් භාවිතා කරන්නේ නම් එය දිනපතා සබන් සහ ජලයෙන් සෝදා, අව්වේ වේලා ගත යුතු අතර හැකිනම් මැදගන්න

මතක තබාගන්න මුඛ ආවරණයක් පැළඳීමෙන් පමණක් කොරෝනා වෛරසයෙන් ආරක්ෂා විය නොහැක. මුඛ ආවරණයක් පැළඳගෙන සිටියත් අන් අය සමඟ මීටර 1 ක පරතරයක් පවත්වා ගන්න, නිතර හොඳින් සබන් යොදා දෑත් සෝදන්න

සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය
சுகாதார மேம்பாட்டு பணியகம்
Health Promotion Bureau
@hpbsrilanka
www.hpb.health.gov.lk

World Health Organization
Sri Lanka
@WHOSriLanka
www.who.int/SriLanka




| Airline | Air fare | Days of Operation |
|---|---|---|
| Sri Lankan Airlines | Starting from Rs. 46,550/- | Tuesdays / Saturdays |
| Emirates | Starting from Rs. 49,500/- | Wednesdays / Fridays / Saturdays / Sundays |
| Oman Air | Starging from Rs. 44,800/- (2 hr transit) | Thursdays |

** Conditions Apply

Ceylon Shipping Lines Travels
No. 450, D.R. Wijewardena Mawatha,
Colombo 10.
011 - 2689500

M : 077 - 2672970
077 - 3572835
077 - 3561210
E : csltravels@sltnet.lk

# කොරෝනා දෙවැනි රැල්ල රටම ගිලගනීද?

**ලෝකය බියවැද්දූ කොරෝනා වෛරසය පළමු රැල්ල ලංකාව ආක්‍රමනය කළ අතර එයට මෙරට ජනතාව සාර්ථකව මුහුන දුන්හ. මාස දෙක හමාරක් තරම් කාලයක් නිහඬව සිටි කොරෝනා ගැන මේ රටේ ජනයා අවධානය අතහැර දැමීය. එය අමතක වී ගියාක් මෙන් සිටිය දී දෙවැනි රැල්ල නැගී ආවේ පළමු රැල්ලට වඩා සිය ගුණයක් විශාලවය.**

මිනුවන්ගොඩ ඇගළුම් කම්හලක සේවිකාවකට එම රෝගය ආසාධනය වී ඇති බව දැනගත් වහාම එම ඇගළුම් හලේ පිරිස් පරීක්ෂණයට භාජනය කළහ. ඇගළුම් කම්හලේ ඇති බහුතරයකට එය වැළඳී ඇති බව දැන ගන්නේ ඒ අවස්ථාවේය.

අනතුරුව පෑලියගොඩ මාළු වෙළඳ සංකීර්ණයේ වෙළෙන්දන් ගේ රෝග පරීක්ෂාව සිදුකළේ අහඹුවක් ලෙසිනි. තත්ත්වය ඊටත් වඩා උත්සන්න වී ඇති බව දැන ගන්නට ලැබුණේ ඒ අවස්ථාවේය. ඒ වන විට මාළු වෙළඳාම් කරන්නන් මගින් ලංකාවේ විවිධ ප්‍රදේශවලට රෝගය පැතිරී තිබුණි.

ඇගළුම් ක්ෂේත්‍රයේ විවිධ ආගමනවලට පැතිරුණ කොවිඩ් වසංගතය මාළු වෙළඳාම හරහා ලංකාවේ විවිද ප්‍රදේශවල ජනයා රෝගීන් බවට පත් කළහ.

ඒ හඳුනා ගැනීමත් සමඟ රටම මහත් බීතියකට පත්වන්නට විය. දිනපතා රෝගීන්ගේ ප්‍රමාණය ඉහළ ගිය අතර දිනකට 400 සීමාව පසුකල අතර එය 700 ඉක්මවා ගිය අවස්ථාද දක්නට ලැබුණි. මේ වන විටත් 500 සීමාව තුළ රෝගීන් පිරිසක් දිනකට වාර්තා වෙයි.

ලංකාවේ විවිධ ප්‍රදේශ වසා දැමූ අතර බස්නාහිර පළාතට දැමූ ඇදිරිනීතිය මාසයකට අධික කාලයක් පැවතුනි. එහි අතුරු විපාක වශයෙන්



ජනයාගේ දෛනික රැකියා අහිමිව ආදායම් පහළ බැසීම හේතුවෙන් බඩගිනින්න කොරෝනා ඉක්මවා ඉහළට අවේය. මාළු වෙළඳ සැල හරහා කොවිඩ් 19 පැතිරීම හේතුවෙන් ජනතාව මාළු මිලදී ගැනීමට උනන්දු නොවුණා පමණක් නොව මාළු ප්‍රතික්ෂේප කළහ.

**මෙවර කොරෝනා රැල්ලේ දක්නට ලැබුණු ප්‍රධාන ලක්ෂණයක් නම් බෝවන වේගය හා ආසාධිතයින් ගේ රෝගී තත්ත්වය ඉතා වේගයෙන් උත්සන්වීමයි. ඇමරිකාව ඉතාලිය බ්‍රසීලය වැනි රටවල පෙන්නුම් කළ වේගවත් ස්වභාවයක් දක්නට ඇත.**

ලක්ෂ තුනකට අධික ධීවර ජනයාත් ලක්ෂයකට අධික මාලු ව්‍යාපාරය නිසා යැපෙන ජනතාවත් රැකියා විරහිතව මේ වන විටත් අසරණ වී සිටිති.

දිනපතා මරණ සංඛ්‍යාව ඉහළ ගිය අතර මරණ සංඛ්‍යාව සියය ඉක්මවා යන්නට ගත වූයේ මාසයක් තරම් කාලයකි.

මෙවර කොරෝනා රැල්ලේ දක්නට ලැබුණු ප්‍රධාන ලක්ෂණයක් නම් බෝවන වේගය හා ආසාධිතයින් ගේ රෝගී තත්ත්වය ඉතා වේගයෙන් උත්සන්වීමයි. ඇමරිකාව ඉතාලිය බ්‍රසීලය වැනි රටවල පෙන්නුම් කළ වේගවත් ස්වභාවයක් දක්නට ඇත. මේ ලියන මොහොත වන විටත් වේගවත් ව්‍යාප්තියක් රට තුළ පවතී. කොරෝනා පිළිබඳ නිවැරදි දත්ත ලබා දිය නොහැක්කේ ඒතරම්ම වේගයෙන් රෝගය ව්‍යාප්ත වීම හා උත්සන්න වීම නිසාවෙනි.

මේ වන විට ප්‍රධාන වශයෙන් කොළඹ මහනගර සභා සීමාව කේන්ද්‍ර කරගනිමින් රෝගය ව්‍යාප්ත වෙමින් පවතී. කොළඹ සිට රටේ සෙසු ප්‍රදේශ වලට යන පිරිස් අතින් මෙම රෝගය ව්‍යාප්තවීමට ඇති ඉඩකඩ ඉතා වැඩිය. පසු ගිය දීපාවලි උත්සවයට කොළඹ සිට කඳුකරයට ගිය ජනතාවගෙන් එම ප්‍රදේශවල ජනයාට මෙම රෝගය බෝවීම පිළිබඳ තොරතුරු අසන්නට ලැබුණි.

මිණුවන්ගොඩ ඇගළුම් කම්හලේ සේවයකළ පිරිස් මාර්ගයෙන් තවත් ඇගළුම් කම්හල් ගණනාවකට මෙම රෝගය ව්‍යාප්තවිය.

කෙසේ නමුත් දැන්



පවතින තත්ත්වය තුළ සිදුව ඇත්තේ කොරෝනා සමඟ ජීවත්වීමට අවශය පසුබිම නිර්මානය කර ගැනීමයි.

සමස්ත ජනයාගෙන් 95% ක් ම මෙම රෝගයෙන් බේරීමට හා පැතිරවීම වලකාලන අන්දමින් කටයුතු කරන බව සත්‍යයකි. නමුත් ඉතාම අතලොස්සක් දෙනෙකු ගේ නොමනා හැසිරීම හේතුවෙන් රෝගය පැතිරීමට පටන් ගෙන ඇත. කෙතරම් කාලයක් රට වසා ඇදිරිනීතිය දමා තිබුණත් මෙම අතලොස්ස ගේ නොමනා හැසිරීමේ රටාව වෙනස් වන්නේ නැත ඔවුන් සමාජයට රෝගය ව්‍යාප්ත කරති.

මොවුන්ට නීතිය ක්‍රියාත්මක කිරීමද පහසු නොවෙයි. කළ යුත්තේ හැකි තරම් ප්‍රවේශම් වී සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කිරීමයි. ඒ තුළින් තම තමා ආරක්ෂාවීම යනු රෝගය තුරන් කිරීමට ඇති එකම මාර්ගයයි.

තවත් භයානක පිරිසක් සිටිති. ඔවුන් රෝග ලක්ෂණ පෙන්නුම් නොකරන රෝගීන්ය. නමුත් මේ මේ අය අතින් අන් අයට බෝවිය හැකිය. එය සිදුවන්නේ එම ආසාධිතයා ද නොදැනුවත්මය. ඒ නිසා තාමත් රෝගය වැළඳී නොමැති කොයි කවුරුත් කළ යුත්තේ මෙම වෛරසයට තම ශරීරයට ඇතුළු වීමට ඇති යම් ඉඩක් ඇත්නම් තවත් එයින් ආරක්ෂ වී කටයුතු කිරීමයි. තමා වටා සිටින සෑම සියලු දෙනාටම මෙම රෝගය වැලදී ඇතැයි යන සැකය උපදවා කටයුතු කිරීමයි. එසේම ඕනෑම පෘෂ්ඨයක් මත ඕනෑම අවස්ථාවක මෙම වෛරසය පතිත වී ඇතැයි යන සැකය උපදවා ගෙන එයින් ආරක්ෂා වන ආකාරයට සිය ජීවිකාව පවත්වා ගෙන යෑමයි.

දිනකට 500 ක සීමාව තුළ රෝගීන් වැඩි වන විට එයට සාපේක්ෂ ප්‍රමාණයක් රෝහල් වලින් සුවය ලබා එළියට එන්නේ නැත. ඒ අනුව රෝහල් රෝගීන් ගෙන් පිරී යන අවස්ථාව කොයි මොහොතක හෝ පැමිණිය හැක. වෙනත් රෝගීන් මෙන් ඇඳන් උඩ ඇඳන් යට කෝරිඩෝ ආදියේ කොරෝනා රෝගීන් තබාගත නොහැක. අනිත් අතින් ආසාදිතයින් ගේ මූලාශ්‍ර හමු නොවන අහඹුලෙස සමාජයෙන් බිහිවන රෝගීන් ගැනද ඉද හිට වාර්තා වෙයි. එයින් පැහැදිලි වන්නේ මෙම රෝගය සමාජ ගතවී ඇති බවකි. එසේ වුව හොත් කොතනින් කෙළවර වේද යන්න සිතාගත නොහැක.

ඇමරිකාව ඉතාලිය වැනි රටවල රෝගීන් ඇති වූ හා මරණයට පත්වූ ආකාරයට ලංකාව තුළ රෝගීන් හා මරණ වාර්තා වන්නට වුවහොත් රටේ ජන ජීවිතයට කොයි ආකාරයෙන් බලපාවිද යන්න සිතා ගැනීම පවා අපහසුය. ඒ තුළින් මතුවන අතුරු ප්‍රශ්න කෙළෙස වෙයිද? කොරෝනා නොවන රෝගීන්ට කුමක් වෙයිද? ජනතාව ගේ ආර්ථිකයට කෙසේ බලපාවිද යන්න අපි කවුරුත් සිතිය යුතුය. දැනට බොහෝ දෙනෙකු ආත්මාර්ථකාමී ලෙස තමා ගැනම පමණක් සිතන අතර කරන කටයුතුවලින් අවසානයේ කොරෝනා වසංගතය ලංකාවට ගිල ගන්නා තැනකට පත්වුවහොත් අපි කුමක් කරමුද?

# නාපාන පේමසිරි නාහිමියෝ දැයෙන් සමුගනිති.



ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහානායක අතිපූජ්‍ය නාපාන පේමසිරි නා හිමියන්ගේ ධර්මඥානය, සිල්වත් කම සහ ගුණවත්කම සමාජයට ආශිර්වාදයක් සහ ආදර්ශයක් වූ බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පවසයි.

උන්වහන්සේ අපවත්වීම සම්බුද්ධ ශාසනයට රටට සමස්ත ලෝක බෞද්ධ ජනතාවට මෙන්ම පෞද්ගලිකව තමාට ද පිරිමැසීමට අපහසු පාඩුවක් බව ජනාධිවරයා කියා සිටී.

පසුගිය 22 දින පස්වරුවේ මහනුවර කණ්ඩසාලේ එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක ජාතික පාසල් ක්‍රීඩාංගනයේ පැවැති ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ මහානායක හූරීකඩුව, මැණික්හින්න, විද්‍යාසාගර පරිවේනාධිපති අග්ගමහා පණ්ඩිත අතිපූජ්‍ය නාපාන පේමසිරි නා හිමිපානන් වහන්සේගේ ආදාහන පූජෝත්සවය අමතමින් මේ බව සඳහන් කළේය.

1922 නොවැම්බර් 30 වන දින මහනුවර නාපාන ග්‍රාමයේ උපත ලැබූ උන්වහන්සේ අපවත්වන විට අනූ අට වියෙහි පසුවූහ. 1933 වසරේදී පැවිදි දිවියට පිවිසි උන්වහන්සේ 1943 වසරේදී උපසම්පදාව ලැබූහ.





ලොව කීර්තිධර මහා තෙරුන්වහන්සේට බුරුම රජය පිරිනමන "අග්ගමහා පණ්ඩිත" සම්මානයෙන් පිදුම් ලැබූ උන්වහන්සේ 2013 වසරේදී රාමඤ්ඤ මහා නිකායේ මහා නායක පදවියට පත්ව අපවත්වන තුරුම එය හෙබවූහ.

නාපාන පේමසිරි නා හිමියන්ගේ ශ්‍රී දේහය පිළිබඳ ආදාහන පූජෝත්සවය පූර්ණ රාජ්‍ය ගෞරව සහිතව සිදු කෙරිණි.


## Ceylon Shipping Lines Ltd.
### Printing Department




CSL Printing is a fully fledged design printing department equipped with latest technology including Computer offset printing from concept to finished product, with the capacity and capability to undertake all types of commercial printing for local & overseas customers.

**Ceylon Shipping Lines Ltd.,
Printing Department,
No. 758/3, Dr. Danister De Silva Mawatha,
Colombo 09.
Tel: 011 - 2683237 Fax: 011 - 2683238
E- mail: cslpri@sltnet.lk**


**Head Office:
Ceylon Shipping Lines Ltd.,
No. 450, D.R. Wijewardana Mawatha,
Colombo 10.
Tel: 011 - 2689500 - 8**






කිතුල්පේ රජ මහා විහාරය

# කිතුල්පේ
# රජමහා විහාරය



පැරැණි සමන් දේව ප්‍රතිමාවක්

**රජමහා විහාර අතර කිතුල්පේ රජමහා විහාරය මහනුවර නගරයේ සිට හගුරන්කෙතට කි.මී. 28 ක් තිබේ. මෙම ප්‍රදේශයේ රජ මහා විහාර බොහෝමයක් පවතී. ඒ අතරින් මෙම ස්ථානය ඉතා වැදගත් වන්නේ දන්ත ධාතූන් වහන්සේ වැඩ සිටි ස්ථානයක් නිසාවෙනි.**



නුවර යුගයේ ප්‍රතිමාවක්

හගුරන්කෙත සිට රිකිල්ලගස්කඩට පැමිණ පොරමඩුල්ල හරහා කි.මී. 15 කින් මෙම ස්ථානයට ළගාවිය හැක. එසේත් නැතිනම් හගුරන්කෙත සිට උනස්තැන්න හරහා කි.මී. 9 ක දුරකින් මෙම ස්ථානයට ගමන් කළ හැකිය. මුහුදු මට්ටමේ සිට අඩි 1500 ක් උසින් පිහිටා ඇති මෙම ස්ථානය හා එතනට පැමිණෙන මාර්ග යේ දී හමුවන පරිසර ස්වභාව සෞන්දර්ය අතිශ්‍ය රමණීය. කඳු හෙල්වංගු සහිත බෑවුම් පසුකර අලංකාර හෙල්මැලි නරඹමින් මීදුම අතරින් එන මෙම ගමන අතිශ්‍ය ආස්වාද ජනක පරිසර හිතකාමී ගමනකි.

අඩි තුන් හාර දාහක් උසින් පිහිටි කඳු ගැට පංතියකින් වටවූ නිම්නයක මෙම පූජනීය ස්ථානය පිහිටා ඇත.

මෙම කිතුල්පේ ගම්මානය පිළිබඳව එංගලන්තය වෙනුවෙන් ලංකාවේ සිටි පාලකයා වූ ජෝන් ඩොයිලි 1815 මාර්තු 22 ඔහුගේ දිනපොතේ සටහන් කර ඇත්තේ මෙම ගම්මානය මහා විහාරයට පූජා කරන ලද ගමක් යනුවෙනි. නමුත් පසුව මෙම ගම්වාසීන් ගැන සැක කළ ශ්‍රී වික්‍රම රාජසිංහ රජු එම ගම තම මාළිගාවේ මුළු තැන් ගෙයි යටතට ගෙන කටයුතු කර ඇති බැවින් තමා (ජෝන් ඩොයිලි) නැවතත් එය මහා විහාරයට පවරන බවයි.

ඉංග්‍රීසි ආක්‍රමනයත් සමඟ වරින් වර මහනුවර ප්‍රදේශයට එල්ල වූ තර්ජන හේතුවෙන් දන්තධාතූන් වහන්සේ ආරක්ෂා කරගැනීම සඳහා විවිධ ස්ථාන වල සඟවා තැබූහ. එසේ දන්ත ධාතූන් වහන්සේ සඟවා ගෙන සිටි එක් ප්‍රධාන ස්ථානයකි. මෙම කිතුල්පේ රජ මහා විහාරය.

"දළදා විත්ති" නමැති පුස්කොළ පොතේ මේ බව ලියවී ඇත. "ශ්‍රී වර්ධන (මහනුවර) පුරයෙන් අප්‍රසිද්ධ ලෙසින් වැඩමවා ගෙන ගොස් හේවාහැට රට බඳ ගිරි දුර්ග ජල දුර්ග වන දුර්ග ආදියෙන් සුරක්ෂිත වූ කිතුල්පේ කියන ගමෙහි ඒ අවස්ථාවට සුදුසු ලෙස කළ මාළිගා මන්දිරයට වැඩමවා තේවාව ආදී බුද්ධ පූජා පවත්වමින් දිවා රාත්‍රී දෙක්හි අප්‍රමාදත්වයෙන් යෙදී තුන් ලෝ වාසීන්ට වැඩ පිණිස බුදුන් වදාළ උතුම් රුවන් සූත්‍ර සතිපට්ඨාන ආදී සූත්‍ර වත් පිරිත් නොකඩ කොට පවත්වමින්..." ආදී ලෙස මේ බව දක්වා ඇත.

මෙම පුස්කොළ පොතෙහි දක්වා ඇති පරිදි දළදාව මෙහි සඟවා තබාගන තිබී ඇත්තේ ක්‍රි.ව. 1802 දීය. 1803 වන විට මෙම ස්ථානයට අවස්ථා තුනකදී දළදාව මෙහි සඟවා තබාගෙන ඇත. මෙම විහාරයේ දළදාව සඟවා තැබූ ස්ථානය නිශ්චිතව හඳුනාගෙන නැත. එක් මතයකට අනුව විහාරයට කි.මී. 1/4 ක් පමණ දුරින් පිහිටා ඇති ගල් ගුහාවක සඟවා තිබූ බවට ද කියවෙයි. තවත් මතයකට අනුව එය පන්සලේම තබා ගත් බවටද කරුණු ඇත. තවත් විටක එය මෙම ස්ථාන දෙකේම තබා ගත්තා විය හැකිය.

විහාර මන්දිරය ජරාවාසව තිබී 1909 දී ප්‍රතිසංස්කරණය සිදුකොට ඇත. මෙහි ඇති ප්‍රතිමා අරත්තන ප්‍රතිමා වලට සමාන බවක් දක්වයි. මෙහි අලංකාර සිතුවම් රැසක් දක්නට ඇත. රාජ්‍ය අනුග්‍රහය ලැබූ විහාරයක් බවට ඉතාමත්ම සාධනීය සාධක දක්නට ඇත. සමන් දේව ප්‍රතිමාවක් ද මෙහි දක්නට ඇත. ප්‍රධාන වශයෙන් ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ අනුග්‍රහය ලැබූ විහාරයකි. 1852.10.26 දරන මහනුවර දිසාපතිගේ සටහන් වල මෙම විහාරය පිළිබඳව මෙසේ දක්වා ඇත.

**"කිතුල්පේ දළදා මාළිගාවට අයත් විහාර ගමකි. එය ආණ්ඩුවට බද්ධක් නොගෙවයි. අනෙක් විහාරගම් මෙන්ම මෙයද ඉතා සශ්‍රීක කදිම ගමකි. කුඹුරු ඉතා දැකුම් කලුය. මනාව සකස් කරන ලද කුඹුරුවල වපසරිය අමුණු 40 ක් පමණ වේ. මෙයින් අටක පමණ අස්වැන්න විහාරයට දෙනු ලැබේ. මාළිගාවේ මුර සේවයට හා පෙරහැර සේවයට ද මේ ගමෙන් පිරිස් සහභාගි විය යුතුය."**

විශාල ගම්මාන රැසක දායක පිරිසක් මෙම විහාරයට සිටින අතර ලංකාවේ රජමහා විහාර අතර කිතුල්පේ රජමහා විහාරයද ප්‍රමුඛස්ථානයක් ගනී.

# Sri Lankan Airlines will be operating below flights From Colombo for the period From 1st – 31st December 2020

| Flight number | Destination | Days of operation | Dep. time | Arr. time | Remarks |
|---|---|---|---|---|---|
| UL101 | MALE | WED | 0825 | 0920 | |
| UL101 | MALE | THU/FRI/SAT/SUN | 0720 | 0815 | |
| UL101 | MALE | MON | 0730 | 0825 | |
| UL103 | MALE | TUE/ SAT | 1945 | 2040 | |
| UL1207 | MILAN | MON / THU | 0005 | 0635 | |
| UL217 | DOHA | MON/ FRI | 1905 | 2135 | |
| UL225 | DUBAI | TUE/ SAT | 1835 | 2150 | |
| UL302 | SINGAPORE | WED / SUN | 0725 | 1355 | |
| UL454 | NARITA | WED/ SAT | 1820 | 0600 | |
| UL 503 | LONDON | MON/THU/SAT | 0010 | 0630 | |
| UL 503 | LONDON | TUE/WED/FRI/SUN | 0110 | 0730 | |
| UL 505 | LONDON | TUE / SAT | 0930 | 1025 | Eff. 12th Dec |
| UL553 | FRANKFURT | WED/ FRI | 2225 | 0520 | |
| UL 604 | MELBOURNE | 6/11/22/27 DEC | 1645 | 0815 | |
| UL 604 | MELBOURNE | 9/16/25/30 DEC | 1410 | 0540 | |
| UL606 | SYDNEY | WED / FRI | 1420 | 0620 | |
| UL866 | SHANGHAI | FRI | 1450 | 2350 | |
| UL880 | CANTON | WED | 1050 | 1900 | |

Ceylon Shipping Lines Travels,
No. 450, D.R.Wijewardena Mawatha,
Colombo 10
011 - 2689500

M : 077 - 2672970
077 - 3572835
077 – 3561210
E : csltravels@sltnet.lk

ස යු රේ න් එතෙර
එතෙර ශ්‍රමයට මෙතෙර උපහාරය......





### ගැලපගොස් ඉබ්බා (Galapagos giant tortoise)

ගැලපගොස් දූපත්වල ජීවත් වෙන මෙම ඉබි විශේෂය දැක ගැනීමට විශාල සංචාරකයන් පිරිස් වැඩි වශයෙන් පැමිණෙනවා. මෙම ඉබ්බන් වඳවී යාමේ තර්ජනයට මුහුණ පා සිටියි. අවුරුදු 190 ක පමණ ආයු කාලයක් ජීවත් වෙනවා. මෙම ඉබ්බෙකුගේ සාමාන්‍ය බර කිලෝ 417 ක් පමණ වේ.

# ආයු බල වැඩි සතුන්

සත්ත්ව ලෝකයේ විවිධාකාර සත්වයන් අපට හමුවෙනවා. වර්තමානයේ සිටින සත්ත්වයන් අතුරෙන් මෙම සත්ත්වයන් වැඩිම ආයු කාලයක් ජීවත් වෙනවා.

### බෙල්ලා Arctica Islandica (Ocean quahog)

මෙම බෙල්ලන් විශේෂය වසර 41 - 405 ත් අතර ආයු කාලයක් ජීවත් වෙනවා. දැනට වාර්තා වන ආයු කාලය අවුරුදු 507 ක් පමණ වෙනවා.

### "ටුටරා" නම් කටුසු විශේෂයක්

කටුසු වර්ගයට සමානකම් කියනා මෙම උරග විශේෂය නවසීලන්තයටම ආවේණිකයි. මෙම කටුසු විශේෂය වසර 100-200 ත් අතර කාලයක් ජීවත් වෙනවා.





### ආඳා (Eel)

ලිස්සන සුළු මත්ස්‍යයෙකු වන ආඳාට අවුරුදු 150 ක පමණ ආයු කාලයක් පවතිනවා.



### මෝරා (Greenland Shark)

මෙම මෝරුන් විශේෂය උතුරු අත්ලාන්තික් සාගරය තම නිජභූමිය කරගෙන ජීවත් වෙනවා. මෙම මෝරුන්ගේ ආයු කාලය අවුරුදු 200 ක් පමණ වෙනවා.

### අලියා (Elephant)

අලියෙකුගේ ආයු කාලය වසර 70-80 පමණ වෙනවා.

### තල්මසා (Bowhead Whales)

මෙම තල්මසුන් විශේෂය වසර 200 ක් පමණ ජීවත් වන බව පැවසෙනවා. මෙම තල්මසුන් විශේෂ හඬකින්ද යුක්ත වෙනවා. මෙම තල්මසුන්ගේ ශරීර තුළ තිබී 1890 කාලයට අයත් බිලී කොකුවල කැබලි සොයාගෙන තිබෙනවා. එමෙන්ම ඇමයිනෝ අම්ල පරීක්ෂාවට ලක්කිරීමෙන් ඔවුන්ගේ ආයු කාලය 177-245 ක් පමණ වන බවයි පැවසෙන්නේ.






CEYLON SHIPPING LINES LTD
SPECIAL RATES ON COURIER PACKAGES
WE HAVE SPECIAL RATES FOR BELOW COUNTRIES
AUSTRALIA
CANADA
USA
NEW ZEALAND
GERMANY
UK
GEORGIA
BELGIUM
SPAIN
Ceylon Shipping Lines LTD
No. 450, D. R. Wijewardena
Mawatha,
Colombo 10.
Tel : 011 - 2689500 - 8
Call us now for the attractive rates,
M :- 0772672970
0773572835
0773561210
E :- csltravels@sltnet.lk

# කෝටියක ලොතරැයිය පන්සලට පූජා කර පැල්පතේ වෙසෙන

# කෝටියේ මාමා



**පන්සලේ කඨින පිංකම ඉවර වූ දාට පහුවදා පොඩි හාමුදුරුවෝ ඇවිත් මම කඨින පිංකමට පූජාකළ ලොතරැයි පත දුන්නා. පුදුමයි. ඊට කලින් දා රෑ දිනුම් ඇදපු අංකයි ටිකට් පතේ අංකයි එකට ගැළපෙනවා. මං පොඩි හාමුදුරුවන්ට ඒ බව කිව්වා" තමන් විසින් පන්සලට පූජා කරන ලද කෝටියක දිනුමක් තිබූ ලොතරැයි ටිකට් පත අතට ලැබූ මොහොතේ ඔහු ක්‍රියා කළේ එලෙසිනි. ලෝභකමකින් තොරව දන් දුන් ඔහු අද දවස ගෙවන්නේ බොහෝ අසීරුතා මධ්‍යයේය. මේ ඔහුගේ අද කතාවයි.**

කුරුණෑගල සිට පොල්පිතිගම ඉබ්බාග මුව මාර්ගයේ කුඹුක්ගැටේ දුනුමඩලාවෙ පන්සලට හැරෙන හන්දියේ වම්පස ඇත්තේ ලොතරැයි විකුණන කූඩුවකි. එහෙත් එදා එය වසා දමා තිබිණි. අපට අවශ්‍ය පුද්ගලයා පිළිබඳ තොරතුරු විමසන්නටද කෙනෙකු ඒ වන විටත් මග නොසිටියේය.

වාහනය සෙමෙන් ඉදිරියට යයි. ඒ මගෙහි ඉදිරියෙන්ම පරණ බෑගයක්ද එල්ලාගෙන යන වයෝවෘද්ධ මහතෙකි. වාහනය ඔහු අබියස නතර කෙරිණි.

"අර... පන්සලේ කප්රුකේ ස්වීප් එකක් එල්ලපු මාමගේ ගෙදර කොහෙද? ඒ ස්වීප් එකට රුපියල් කෝටියක දිනුමකුත් ඇදුණේ." මම විමසීමි.

"ඒ මම තමයි මට ගමේ කවුරුත් කියන්නේ කෝටියේ මාමා කියලා යමු එහෙනම් ගෙදරට.."

ඔහු අප හඳුනා ගත්තේය. පිළිගත්තේ ආදරයෙනි. දැන් ඔහුගේ ගරා වැටුණු නිවෙස පසෙකින් සිමෙන්ති ගලින් බැඳී නව නිවසකි. බැලූ බැල්මටම පෙනෙන්නේ ඔහු බොහෝ බැරි අමාරුකම් මධ්‍යයේ ජීවත්වන බවකි.

"මං අවුරුදු ගාණක් තිස්සේ ස්වීප් විකුණලා තමයි ජීවත්වෙන්නේ. එදා පන්සලේ කඨින පිංකම දවසේ මට පූජා කරන්න දෙයක් තිබුණේ නැහැ. මම කප්රුකේ ලොතරැයි පතක් එල්ලුවා. පන්සලේ පොඩි හාමුදුරුවෝ පහුවදා ලොතරැයිය අරගෙන ආවා. දිනුම් ඇදිලද කියලා බලන්න. මේ ඇත්තමයි කෝටියේ දිනුම ඇදිලා තිබුණේ මම එදා කප්රුකේ එල්ලපු ස්වීප් ටිකට් එකට. මම හාමුදුරුවන්ගේ නම ලිපිනය ලිව්වා. දිනුමේ මුදල් ගන්න දවසේ මමත් ඒ උත්සවයට ගියා."

බොහෝ අගහිඟතා මධ්‍යයේ ජීවත්වුවද තමන් පූජා කළ ලොතරැයි පතට කෝටියක මුදල් දිනුමක් ඇදුණු බව දැනගත් මොහොතේ පියසේන මාමා. ඔහුගේ බිරිය මෙන්ම දූ දරුවෝ සාධුකාර දුන්හ.

හොර බොරු වංචා නැති පියසේන මාමා අද ද ඒ පිළිබඳ තණ්හා සිතුවිලි පහළ කරගෙන නැත්තේය. එදා දෑත් එක්කර සාධුකාර දුන් පියසේන මාමාගේ බිරියගේ වම් අත අද පණ නැත. ඇයට තනිවම ඇවිද යෑමට පවා නොහැක. අංශභාග රෝගයෙන් පෙළෙන ඇය බාගෙට සාදා ඇති නිවෙසේ සාලයට වී පාර දෙස බලා සිටින්නීය.

"ඒ ලොතරැයි දිනුම ඇදිලා මාස කිහිපයකට සෝදලා පිරිසිදු කරලා තමයි හන්දියට යන්නේ. අපේ ලේලි නාලිකා මගේ බිරියව හොඳින් බලා ගන්නවා. මට කනගාටු මගේ බිරිය ඔත්පල වෙච්ච එක ගැන පමණයි." පියසේන මාමා පවසන්නේ



කනගාටුවෙනි.

ඔහු දැන් හැත්තෑ අටවැනි වියෙහි පසුවන්නේය. අප යන විට සාලය පුරා වී වේළෙන්නට දමා තිබිණි.

"ස්වීප් විකුණන්නයි මේ වැඩ කරන්නයි අමාරුයි. අපිට ලැබුණු වී ටික ගෙයි බිම දැම්මා. මේ ගේ කැල්ල හදලා දුන්නේ ලොතරැයි මණ්ඩලයෙන් ගමේ සමහරු මට බණිනවා මං මෝඩයෙක් කියලා."

"ඒ මොකද?" අපි විමසුවෙමු.

"මම කෝටිය ඇදුණු වෙලාවේ ඒක තියාගත්තේ නැහැ කියලා තමයි කියන්නේ. ඒත් මට ඒක අයිති කරගන්න ඕන කියන සිතිවිල්ල ඇති වුණේ නැහැ. ජීවිතේ කවදාවත්ම මම වංචාවක් හොරකමක් කරලා නැහැ. එහෙම එකේ ඔය ලොතරැයියට මොකටද බොරු කරන්නේ. මං හැමදාම සිතුවේ එහෙමයි. මාව ලොතරැයි මණ්ඩලයෙන් ගෙනල්ලා ඇගයීමක් කළා. ඔවුන් තමයි මගේ ගරා වැටුන ගේ හදලා දුන්නේ. පන්සලේ හාමුදුරුවෝ ඒ ලොතරැයි දිනුමෙන් ලබපු මුදලෙන් මට රුපියල් ලක්ෂයක් දුන්නා. නමුත් ලොතරැයි මණ්ඩලයෙන් දුන්න මුදලින් ගෙයි කොන්ත්‍රාත්තුව බාරගත්ත මිනිහා වැඩේ සම්පූර්ණ කරලා දුන්නේ නැහැ. ඔහු කීවා මුදල් මදි කියලා. පරණ ගේ කඩා වැටුනා. ඊට පස්සේ මම හන්දියේ ත්‍රිවීල් වල ඉන්න දරුවන්ටයි. තවත් කිහිපදෙනෙකුටයි ආරාධනා කරලා ගෙට ගෙවැදුනා. කිරිබත් ටිකක් උයලා කැවුම් ටිකක් හදලා එදා ආ අයට සංග්‍රහ කළා."

පියසේන මාමා පවසන්නේ තමන් අලුත් නිවසට පැමිණි ගමනය. නමුදු ඒ ගෙය අංග සම්පූර්ණ නැත. බිත්ති කපරාරු කර නැත. උළුවහු දොර ජනෙල් නැත. තවමත් ඔවුන් ගෙවන්නේ දුක්ඛිත ජීවිතයකි. දිනපතා ලොතරැයි විකිණීමෙන් ලබන සුළු මුදල ඔවුන්ගේ වියහියදම් පියවන්නේය.

"ජීවත්වෙන්න අමාරුයි තමයි. බිරිය රෝහලට ගෙනියන්න ඕනෑ. මාසයකට දෙවරක් විතර. කෝටියක මුදල පන්සලට ඇදුණු දවස්වල හුඟක් අය මගෙන් ස්වීප් ගත්තා. දැන්නම් එහෙමට කියලා විකිණෙන්නේ නැහැ. මං උදේ ගෙදර අස්පස් කරලා බිරියගේ වැඩ කටයුතු කරල මීගහමුල හන්දියට යනවා. ඉන් පස්සේ එතැන තියෙන බුදු පිළිමය ළඟ අතුපතු ගාලා පිරිසිදු කරලා මල් පහන් පූජා කරලා දවස පටන් ගන්නවා. මං පව් කරලා නැහැ. මේවා සංසාරේ ගෙනා කර්ම පුතේ." පියසේන මාමා කතාව හමාර කළේ එළෙසිනි.

"මුදල නොව පරම ධනය වන්නේ සතුටයි."

**බොහෝ අගහිඟතා මධ්‍යයේ ජීවත්වුවද තමන් පූජා කළ ලොතරැයි පතට කෝටියක මුදල් දිනුමක් ඇදුණු බව දැනගත් මොහොතේ පියසේන මාමා. ඔහුගේ බිරිය මෙන්ම දූ දරුවෝ සාධුකාර දුන්හ. හොර බොරු වංචා නැති පියසේන මාමා අද ද ඒ පිළිබඳ තණ්හා සිතුවිලි පහළ කරගෙන නැත්තේය.**






# භාණ්ඩ ප්‍රවාහනයේ දැවැන්තයා සිලෝන් ෂිපිං ලයින්ස්









ශ්‍රී ලංකාව තුළ සේවාවන් රැසක් සිදුකරන විශාලම ව්‍යාපාරික සමාගමක් වන සිලෝන් ෂිපිං ලයින්ස් ආයතනයේ විවිධ වූ සේවාවන් අතරින් භාණ්ඩ ප්‍රවාහනයද ප්‍රධාන අංගයකි. කොළඹ, මරදාන, ඞී. ආර් විජේවර්ධන මාවතේ, අංක 50 හි පෙවත් මරදානේ ප්‍රසිද්ධ “ගාමිණී හෝල් හංදිය” ඉදිරිපිට ප්‍රධාන කාර්යාලය පිහිටා ඇත.

ලොව ඕනෑම රටක සිටින අයෙකුට හෝ ආයතනයකට ලංකාවේ සිටින ඔබ සතු යම් භාණ්ඩයක් නියමිත පරිදි නියමිත වේලාවට පූර්ණ ආරක්ෂාව යටතේ යැවීමට අවශ්‍ය නම් ඒ සඳහා සුදුසුම ආයතනය සිලෝන් ෂිපිං ලයින්ස් හි නාවික දෙපාර්තමේන්තුවයි.

ඕනෑම ප්‍රමාණයක භාණ්ඩ මෙම සේවාව හරහා විදෙස් රටවලට ප්‍රවාහනය කරගත හැක. මේ සඳහා ක්‍රම තුනක් අනුගමනය කරයි.

* **නැව් මගින් අදාල රටට යැවීම**
* **ගුවන් මගින් ආදාල රටට යැවීම**
* **ගුවන් මගින් යවා අදාල රටේ අදාල ආයතනයට හෝ පුද්ගලයාට හෝ බාර දීම**

මේ සඳහා සිලෝන් ෂිපිං ලයින්ස් නාවික අංශයේ විශේෂඥ දැනුම ඇති නිලධාරීන් සිටිති. ඔබේ අවශ්‍යතාව ඔබගේ භාණ්ඩ වල ස්වභාවය ඔවුන්ට ප්‍රකාශ කිරීමෙන් ඔවුන් භාණ්ඩ ප්‍රවාහනය සිදුකළ යුතු ආකාරය පිළිබඳ පැහැදිලි විස්තරයක් ලබා දෙනු ඇත. ඒ අනුව ඔබට කළ යුත්තේ කුමක් දැයි තීරණය කළ හැකි වනු ඇත.

ඊට අමතරව කන්ටේනර් බහාලුම් අපනයනය කිරීම්ද භාරග නු ලබයි. ලංකාවෙන් විදේශ රටක සිටින ඔබගේ ඥාතියෙකු හිතවතෙකුට එසේත් නැතිනම් යම් ආයතනයකට යැවීමට අවශ්‍ය ඕනෑම ප්‍රමාණයක භාණ්ඩ ප්‍රවාහනය සඳහා ඇනවුම් බාර ගනු ඇත.

මීට අමතරව වෙනත් රටක සිටින ඔබගේ ඥාති හිතවතෙකුට හෝ ආයතනයකට ඉතා ඉක්මනින් ලබා දීමට අවශ්‍ය ලිපි ලේඛන එසේත් නැතිනම් තෑගි භාණ්ඩ ආදී ඕනෑම ද්‍රව්‍යයක් කුරියර් සේවාවන් හරහා අදාල පුද්ගලයාට හෝ ආයතනයට ලබා දීමේ හැකියාවද සිලෝන් ෂිපිං ලයින්ස් නාවික අංශය සතුව ඇත.

එමගින් සිදුකරන තවත් සේවාවක් නම් ලංකාවේ වරායට හෝ ගුවන් තොටුපලට හෝ රේගුව බාරයට ආ භාණ්ඩ ඇතිනම් ඊට අවශ්‍ය නෛතික ක්‍රියා පිළිවෙල අනුගමනය කරමින් අදාල ආයතනයට හෝ පුද්ගලයාට නිදහස් කර අදාළ ස්ථානයට ප්‍රවාහනය කරදීමේ ඉහළම පහසුකම් වලින් සමන්විත ආයතනයකි.

ඊට අමතරව ආනයන අපනයන කටයුතු සඳහා අවශ්‍ය කරන සියලුම ප්‍රවාහන පහසුකම් වලින් කිසිඳු අඩුවක් නොමැති ආයතනයක් වන සිලෝන් ෂිපිං ලයින්ස් නාවික අංශය ඔබට අවශ්‍ය සියලුම විශේෂඥ දැනුම ද ලබා දෙනු ඇත.

සිලෝන් ෂිපිං ලයින්ස් නාවික අංශය විසින් මෙම සේවාවට අමතරව නාවික

**භාණ්ඩ ආනයනයේදීත් අපනයේදීත් ඇතුළු සියලු නාවික කටයුතු වලදී ඒවායේ ආරක්ෂාව හා විශ්වාසය පූර්ණ වශයෙන් රැකගන සිය සේවාවන් ඉටුකරනු ලබයි.**

ඒජන්තවරුන් වශයෙන්ද කටයුතු කරන අතර නැව් සඳහා අවශ්‍ය සේවා පහසුකම් සැපයීමද සිදු කරයි.

ඒ අනුව නාවික ක්ෂේත්‍රයේ නියැලී සිටින ජාත්‍යන්තර නැව් සඳහා ද ලංකාවේ වරායවල් වල නැංගුරම් ලා ඇති නැව් සඳහා ද අවශ්‍ය කරන පානීය ජලය, ආහාරපාන, බෙහෙත් හේත් ඇතුළු එම නැව් වලට අවශ්‍ය සියලු පහසුකම් සපයා දීම සිදු කරයි. ඒ සඳහා නියෝජිත ආයතනයකි.

මෙම සියලු සේවාවන් එක් තැනකින් සිදු වන ආයතන ඇත්තේ ඉතා ස්වල්පයකි. එවැනි ආයතන අතරින් සිලෝන් ෂිපිං නාවික අංශය ඉදිරියෙන්ම සිටින ප්‍රමුඛ පෙළේ ආයතනයක් වෙයි.

භාණ්ඩ ආනයනයේදීත් අපනයේදීත් ඇතුළු සියලු නාවික කටයුතු වලදී ඒවායේ ආරක්ෂාව හා විශ්වාසය පූර්ණ වශයෙන් රැකගන සිය සේවාවන් ඉටුකරනු ලබයි.

ඔබ සතු භාණ්ඩ විදේශ රටක සිටින ඔබගේ ඥාති මිත්‍රයෙකුට හෝ එම රටක ආයතනයකට හෝ භාණ්ඩ වශයෙන් හෝ ලිපි ලේඛන වශයෙන් හෝ යැවීමට ඇත්නම් ඒ සඳහා විශ්වාසනීය ආයතනයක් වශයෙන් සිලෝන් ෂිපිං ලයින්ස් නාවික දෙපාර්තමේන්තුව හඳුන්වා දිය හැක. ඔබගේ සියලු භාණ්ඩ සඳහා රැකවරණයද සහතික වනු ඇත.

ඉතාම ලාභදායී තරගකාරී මිල ගනන් යටතේ අවම මිලකින් ඉක්මන් සේවවක් සපයා ගැනීමට ඔබට හැකි වනු ඇත.

**විදේශ රටකට යැවීමට ලොකු කුඩා යම් භාණ්ඩයක් හෝ ලිපි ද්‍රව්‍යයක් හෝ එසේත් නැතිනම් අපනයන භාණ්ඩ හෝ ඇත්නම් ඔබ දුරකථන අංක 0112689500 අංකයට කතාකරන්න. ඔබට අවශ්‍ය සියලුම තොරතුරු ලබාගත හැකිය. ඊට අමතරව 0777224624 අංකයට පූජිත ලියනගේ මහතා අමතන්න.**

# කුරුල්ලන් තුන් දහසකට දිනපතා කන්න දෙන දුප්පත් දානපතියා



**ඔහු ධනයෙන් පොහොසත් නොවූවත් පරිත්‍යාගයෙන් පොහොසත්ය. දන් දෙන්න දුප්පතුන්ට බෑ කියන්නේ දන් දෙන්න ආශාවක් නැති අයයි. ඉන්දීය ජාතිකයෙකු වන හර්පුක් බායි දුප්පතෙක් වුවත් සතුන් දහස් ගණනකගේ දිනපතා කුස පුරවන්නේ ඉතා සතුටිනි.**

**දිනපතා මෙම සතුන් ඔහු සොයා ඔහුගේ ගෙවත්තට පැමිණෙන්නේ කටට අහරක් නොවරදින බව දැනගෙනය.**

ගුජරාටයේ බුනාගාත් දිස්ත්‍රික්කයේ පදිංචි ඔහු හර්ෂුක් බායිය. සෑම දිනකම ගිරව්, ගේ කුරුල්ලන් සහ වී කුරුල්ලන් දෙදහස් පන්සීයක් තුන් දහසක් අතර සංඛ්‍යාවක් ඔහුගේ ගෙවත්තට ඉගිල එන්නේ හර්ෂුක් බායි වෙතින් පිදෙන අහරින් කුසගිනි නිවා ගැනීමටය. වසර දාහතක සිට ඔහු මේ සද්කාර්ය කරනුයේ කිසිම පැකිළීමකින් තොරවය.


හර්ෂුක් බායි කුරුල්ලන්ට ආහාර දීම ආරම්භ කළේ වසර දෙදාහේදී හදිසි අනතුරකින් එක්තැන් වීමත් සමගය. කිසි තැනක යා ගත නොහැකිව ගෙට කොටුවූ ඔහු දැකීමට දිනක් ගම්බද සිට මිතුරකු පැමිණියේ ගොවිපොළෙන් ලබාගත් ධාන්‍ය මල්ලක් ද අතැතිවය. හර්ෂුක් බායි ඉන් ධාන්‍ය කරලක් සිය නිවෙසේ උඩු මහලේ සඳළු තලයේ එල්ලුවේ නිකමටය. ධාන්‍ය කරල කෑමට වැඩි වේලාවක් නොගොස් ගිරවෙක් පැමිණියේය. එලෙස මාසයක් යද්දී ඔහුගේ සඳළුතලයට එන ගිරව් සංඛ්‍යාව 100 ක් 150 අතර වූහ. වැඩිකල් නොගොසින්ම ඒ අතරට ගේ කුරුල්ලෝ ද එක්වූහ.

මෙලෙස කුරුල්ලන් සංඛ්‍යාව වැඩිවෙත්ම තම නිවෙසේ සඳළුතලයේ උන්ට ආහාර දීමට තරම් ඉඩකඩ නොමැති බව හර්ෂුක් බායිට වැටහිණි. එතැනදී ඔහු කළේ පරණ පයිප්ප කීපයක් සොයා ගෙන ඒවායේ සිදුරු විද පක්ෂීන්ට වැසීමට රාක්ක කීපයක් තැනීමය. ඔහු ධාන්‍ය කරල් ඒ රාක්ක වල රැඳ වූ අතර කුරුල්ලෝ පහසුවෙන් ඒ මත වසා ධාන්‍ය ආහාරයට ගත්හ. මෙලෙස කාලයක් ගත වෙද්දී හර්ෂුක් බායි හා ඔහුගේ පවුලේ උදවිය එතැනට තව තවත් ධාන්‍ය රඳවන රාක්ක එක් කළහ. වසර දාහතක් අවසානයේ



ඔහුගේ ගෙවත්තේ ධාන්‍ය කරල් 2700 ක් එල්ලීමට හැකි වන සේ රාක්ක සවි කෙරිණි. හර්ෂුක් බායිගේ පවුලේ උදවිය දිනකට දෙවරක් මේ රාක්කවල ධාන්‍ය කරල් එල්ලති. දවස පුරාම එහි වසා සිටින කුරුල්ලෝ ගබ්ද නගා හඩ නංවමින් ධාන්‍ය බුදින අන්දම දැක ඔවුන් අපමණ සතුටක් ලබති. හර්ෂුක් බායි ජීවත් වන්නේ පවුලේ සුළු ව්‍යාපාරයෙන් ලබන ආදායමෙනි. මෙලෙස කුරුල්ලන්ට ආහාර දීම සඳහා වසරකට ඔහු ඉන්දියානු රුපියල් ලක්ෂ දෙකකට ආසන්න මුදලක් වැය කරයි. දැන් ඔහුගේ මුණුපුරන් ද මෙම සත්කාර්යට එක්වී ඇති අතර නිවසට එන කුරුල්ලන් ද දැන් පවුලේ සාමාජිකයින් තරමට මේ පවුලට එක්වී ඇත.

"අපේ පවුලේ හැමෝගෙම එකම සතුට හා විනෝදාංශය මෙයයි. අපි දිනපතා හොඳ



වටිනා ඇඳුම් අදින්න කැමතියි. එලෙස අඳින ඇඳුම් අපවිත්‍ර වූ විට අපි ඒවා සෝදා අඳිනවා. මෙයත් එලෙසමයි. අපි කුරුල්ලන්ට ආදරෙයි. උන් අපේ ගෙමිදුලේ වහලා අපවිත්‍ර කළ පසු අපි ඒවා ද පිරිසිදු කරනවා. ඒ දේ අපට දැන් හුරුවෙලා යැයි" හර්ෂුක් බායිගේ මුනුබුරා ක්‍රිපාල් පවසන්නේය.

කාලයක් යනතුරු නගරය මැද්දේ ජීවත් වූ ඒ පවුල ගෙමිදුලට එන කුරුල්ලන් වැඩිවෙත්ම නගරයෙන් එපිට ඉඩකඩ ඇති ඉඩමක නිවෙසක් තනා පදිංචි විය. අක්කර හතරක් පමණ වූ ඒ ඉඩමේ ඔවුන්ගේ නිවෙස වටා කුරුල්ලන්ගේ පහසුව සඳහා රාක්ක හා දිය බොන ස්ථාන සවිකර ඇත්තේය.

"මගේ පරණ ගේ අවට පදිංචි අයට කුරුල්ලන්ගේ ශබ්දයෙන් කරදර වුණා. උන්ගේ ආහාරයට දුන් ධාන්‍ය කරල්වලින් අවට අපවිත්‍ර වුණා. ඒත් ඔවුන් කවදාවත් ඒ ගැන පැමිණිලි කළේ නෑ. එහෙත් මේ කුරුල්ලන්ට ඉඩකඩ අවශ්‍ය නිසා මා වෙනත් තැනකට ආවා" යැයි හර්ෂුන් බායි පවසයි.

දැන් ඔහුගේ නිවෙසට ගිරවුන්ට අමතරව ගේ කුරුල්ලන් එන්නේ රංචු පිටිනි. ඉන්දියාවේ ඇතැම් ප්‍රදේශවල ගේ කුරුල්ලන් සහමුලින් වඳවී යෑමේ තර්ජනයට ලක්ව සිටියදී ගේ කුරුල්ලෝ ඔහුගේ නිවෙසට පැමිණ බිත්තර දමා රැක පැටවුන් ද රැගෙන ඉගිළ යති. මේ නිවස කුරුල්ලන්ට එතරම්ම සුරක්ෂිතය. එපමණක් නොව දැන් හර්ෂුක් බායි සිය ගෙවත්තේ ගුරුල්ලන්ට කැදලි තැනීම පහසුවන සේ වැටකොළු හා පතෝල වැල් සිටුවා ඇත්තේය. ගේ කුරුල්ලෝ එම වැල් ගොන්නේ හැසිරීමට ප්‍රිය කරති. හර්ෂුක් බායි සිය අසල්වැසියන්ට ද එම බීජ ලබාදී එළවළු වගාවට උනන්දු කරවයි.

කුරුල්ලන්ට බඩ කට පුරා ආහාර දෙන හර්ෂුක් බායි පරිසර හිතකාමියෙක් මෙන්ම ගොවියෙක් ද වේ. අත්හදා බැලීම් කරමින් නව කෘෂි නිපැයුම් කිරීමටද ඔහු ප්‍රිය කරයි. මෑතකදී ඔහු බිම සිටුවා අල බහින අල වෙනුවට පොළොව මතුපිට වැල්වල හැදෙන අල විශේෂයක් හඳුන්වා දුන්නේ ඔහුගේ නවතම කෘෂි නිෂ්පාදනයක් ලෙසිනි. පෝෂණ ගුණයෙන් අනූන එම අල වර්ගය නිපදවීම වෙනුවෙන් ගුජරාට ආණ්ඩුව ඔහුට ක්‍රිෂි රත්නා සම්මනය පුද කළේය.

"මේ කුරුල්ලන්ගේ පැමිණීම මට ආශීර්වාදයක්. එසේම කුරුල්ලන් හා සතුන් රැ කබලා ගැනීම අපේ යුතුකමක්" යැයි පවසන හර්ෂුක් බායි වසර මුලදී මේ සද්කාර්යය වෙනුවෙන් ඉන්දීය හිටපු ජනාධිපති ප්‍රනාබ් මුකර්ජී අතින් ශ්‍රීස්ති සම්මානයෙන් ද පිදුම් ලැබුවේය.

පරිසරය විනාශ කිරීමටත් සත්ව හිංසනයටත් සමාජය යොමු වී සිටින මෙවන් යුගයක හර්ෂුක් යනු මානව දයාවෙන් යුත් පරිසර හිතකාමී මිනිසෙකි. මෙවැනි මිනිසුන් ලොව පුරා බහුලව සිටීනම් මිනිසාත් පරිසරයත් සියලු සත්වයනුත් කොයිතරම් සතුටින් ජීවත් වනු ඇද්ද?

# ATTRACTIVE AIR FARES TO MIDDLE EAST & OTHER COUNTRIES

## Sri Lankan Airlines Schedules

| Flight Number | Destination | Daye of Operation |
|---|---|---|
| UL 225 | Dubai | Tuesday / Saturday |
| UL 217 | Doha | Monday / Friday |
| UL 503 | London | 7 days of the week |
| UL 606 | Sydney | Wednesday / Friday |

## Emirates Airways Schedules

| Flight Number | Destination | Daye of Operation |
|---|---|---|
| EK 649 | Dubai | Wednesday / Friday / Saturday / Sunday |

## Qatar Airways Schedules

| Flight Number | Destination | Daye of Operation |
|---|---|---|
| QR 669 | Doha | 7 days of the week |

## Oman Airways Schedules

| Flight Number | Destination | Daye of Operation |
|---|---|---|
| WY 372 | Muscat | Thursdays |

*Call For further details,*

**Ceylon Shipping Lines Travels**
**450, D.R. Wijewardena Mawatha,**
**Colombo 10**
**011 - 2689500 - 8**

**M : 077-2672970**
**077-3572835**
**077-3561210**
**E : csltravels@sltnet.lk**

# ලෙඩ්ට මුල

හදවත ආබාධ සහ රුධිරයේ සීනී
පිළිකා ආතරයිටීස් වකුගඩු හානී
මේවා අසා නැත ඉතිහාසයෙ පැරැණී
ජාතිය ලෙඩුන් වී ඇත කාටත් නොදැනී

තුන්වේලට ඉදුනු බත වී එක්වේල
කන්නේ රයිස් සතුටක් එය සුවිශාල
තෝසේ පරාටා මස්හොඳි සව්බෝල
වේදය ගිලදමති පිරිමසමින් වේල

රසගුණ සපිරි මුං ඇට කිරිබත කෑම
විස නැත පළා මැල්ලුම් කොළ කැඳ බීම
අතහැර පුරුදු වී අරුමෝසම් කෑම
නොයෙකුත් ලෙඩ කියති හේතුව නොදනීම

ඩබ්ලිව්. ඒ. විජේරත්න

# රැයක මුසු සෙනෙහස

රන් කිරි කලස හිස ඉහිරී ගනු ලද්ද
නා ගස නුඹට තවමත් නිදි මත නැද්ද
මද පවනටම කෙතරම් මුදු වී ඇත්ද
අම්මා වරුන්ගේ නැළවිලි ගී සද්ද

තාරකා පෙළට මෙය පෙනුණාවත්ද
මාළිගාව පැල්පත් අතරින් එත්ම
සැඹ පිතු සිහින පුතු හිස පිරිමැද්ද
ආකහේ අඳියි අරුණලුවට ඇල්ම

පෙමිලා ඉලේසිංහ

# ඈ කොතැනද?

ඉවුරුතලා ඇදෙන ලෙස ගඟ
පතුරුවා නොනැවතී කිකිණි හඩ
සැහැල්ලුව කෙටි ගවුමකින් හැඩකළ
සොඳුරු කෙල්ලක සොයමි ඈ දුටුවෙද

සැනසුමේ මල් කිණිතක්ව පීදුණ
සුවඳින් සිතැගි සිත් දළුව සරුකළ
දිනක විඳි සහනයක් මිටට ගෙන
තැනක සැංගුව සෙරකි ඈ දුටුවෙද

හැඳුණුම්පතට වයස එනවිට
පිට නොවන සිනාව තරව සිර කර
බැඳ තබනට නිතර ලද අණ මැද
මායිමක සිරකළ ඈ දකිණු කොතැනද

රැළි සමඟ ගොස් නැවත වෙරළට එන
එකට ගත් පාටීවියේ සිනා පොකුරක
පරඬැලක් හෝ දකින සරතැස
මතක උල්පත පීරනා ඈ කොතැනද

නිබ්බුත පද ගයා නිවුණා වෙද
තැල තැලී යකඩ් විලසම
කුරුලු කූඩුව රැකී වීර පබැඳුම
තේ මංඩි සෝදනා 'තර ගයන ඈ දුටුවෙද

මවක විඳි දහනය හා සයනය
ළිප මත දැවෙන වළඳකට කොඳුරන
දීගෙකට ඇමුණූ පුතුගෙ සනහස
පපුව'ත තරට සඟවගත් ඈ කොතැනද

හවසක ලා හිරු කිරණ විඳ විඳ
පෙර දිනක රාව නැගි සැනසුම
හෙමි හෙමින් ඉදලකට පමණක් මුමුණන
යළි යළි සොයමි ඈව දුටුවෙද....

තුෂාරිකා ඇන්තනි.



# දළදා පුරයට

දළදු සමිඳුන් වඳින්න ඈත ඉඳන් අපි ඇවිදින්
දුරින් තිබෙන කරඬුවෙ ඡායාව දකිනවා...
හිතේ තියෙන ශ්‍රද්ධාවට කරඬුවෙ ද සමිඳු මවන්
සාදු නාද දී අපි ද සමිඳු වඳිනවා...
සතුටු කඳුළු වැල් නෙතගින් හිමින් වැටෙනවා...

දුර බැහැරක සිට ආවත් මිසදුටු මහ නායකයින්
බාධාවක් නැතිවම ද සමිඳු බලනවා...
ගරුබුහුමන් ඇතිව ඉතින් කොතරම් දෙරගුළු දැම්මත්
ඉහළ නියෝගෙට කරඬුවෙ අගුල අරිනවා....
මිසදිටුවන් අබියස ද සමිඳු වඩිනවා...

දවස් ගණන් ඇප කැප වී බාරහාර ගැටගසමින්
ජේවී දළදු පුරයට අපි පැමිණෙනවා...
බුදු සමිඳුන් සිටියා නම් බලයට යට වුණු මේ කල
අසරණ වෙන් නෑ මේ හිත් බුදුන් දකිනවා....

බලයට ධනයට බුදුගුණ නම් නොනැමෙනවා....

මදුසංක සමරවික්‍රම
මාතර






# දික්කසාදය

ඉසුරුමුණියේ පෙම් යුවළ
ගලක කැටයම් කළ නිසා
ඉන්නවා නොව එක් වෙලා
වෙන්ව යන්නට බැරි නිසා

බෝදාගම සුමන හිමි


Ceylon Shipping Lines Ltd.

- Container Freight Station
- Weighbridge Facility
- Container Storage, Repair & Haulage
- Reefer Monitoring
- Container Shifting, Stuffing, De-stuffing
- BIO Verification Centre








No. 70, Avissavella Road, Wellampitiya.
Tel. +94 - 11 -2043424, +94 - 11 -2572405
Fax. +94 - 11 -2572050
E mail. cslope@sltnet.lk, cslodt@sltnet.lk

Head Office:
No. 450, D.R. Wijewardane Mw, Colombo 10.
Tel. +94-11-2689500 Fax. +94-11-2689510
Web. www.ceylonshippinglines.lk

# අඳුර පලවා හරින දීවාලී හෙවත් දීපාවලී

**මේ දීපාවලී සමරන මාසයයි. මෙය හිංදු භක්තිකයින්ගේ ප්‍රධාන උත්සව අවස්ථාවකි. හිංදු දහම දේව භක්තිය මුල් කරගෙන ගොඩනැගුණ ආගමකි. දෙවිවරු විශාල සංඛ්‍යාවක් හිංදු දහම හා බැඳී සිටිති. ඒ ඒ දෙවියන් ඒ ඒ කටයුත්ත සඳහා ප්‍රමුඛ වන අතර විෂ්ණු බ්‍රහ්ම ශිව යන ත්‍රිමූර්ථිය එහි ප්‍රධාන වෙයි. එහෙත් දීපාවලී සඳහා ගණ දෙවියනුත් දුර්ගා දේවියත් ප්‍රධාන කරගෙන සිදුවන්නකි.**



පෘථිවිය වරක් සූර්යා වටේ ගමන් කරන විට අපිට අවුරුද්දක් වුවත් දෙවියන්ට එය දිනක් වශයෙන් හිංදුන් සලකති. දෙවියන්ට එම දවස ආරම්භ වන්නේ මේෂ රාශියෙනි. රාශි දොළසක් නිසා දිවා කාලයට රාශි හයකි. රාත්‍රී කාලයට රාශි 6 කි. රාත්‍රිය ආරම්භ වන්නේ තුලා රාශියෙනි. රවි ග්‍රහයා මේෂයෙන් ආරම්භ වී තුලාවට පැමිණෙන විට රාත්‍රිය ආරම්භ වෙයි. සූර්යා අනුග මනය කරන සුරයන් රාත්‍රියේ නින්දට යන අතර අඳුර අනුග මනය කරන අසුරයන් රාත්‍රියට අවදිවෙයි. ප්‍රේත පිසාච භූත කොටස් ඒ ගණයේ ලා සලකයි.



එහෙත් විග්නේෂ හෙවත් ගණේෂ වන ගණ දෙවියන් ඊට වෙනස්ය. ඔහු රාත්‍රී කාලයේ අවදිව සිටින දෙවි කෙනෙකි. කුඩා ළමයෙකු වශයෙන් හඳුන්වන ගණ දෙවියන්ගේ අයියා කතරගම දෙවියන්ය. ඔහු තරුණ වියට පත් තරමක දඩබ්බරයෙකි. ගනේෂ් සියලු සෘෂීන් අවදිකරවන අතර අවදිවන සෘෂීන් මන්ත්‍ර ගායනා කරමින් ධ්‍යාන වඩති. ඒ අඳුර දුරලා ආලෝකය උදාකර ගැනීම වෙනුවෙනි. සෘෂීන් මෙසේ අවදිව ආලෝකය සොයා ගැනීම වෙනුවෙන් සිය ධ්‍යාන ශක්තිය වඩන විට භූත කොටස් මේ අයට හිරිහැර කරති. එවිට ඔවුන් ගනේෂ ගේ පිහිට බලාපොරොත්තු වෙති.

එවිට ගනේෂට ඒ උපකාරය කළ නොහැක. ඔහු සිය මව වන දුර්ගා සොයා යයි. දුර්ගා ඒ වන විට රාත්‍රිය බැවින් නිදිය. ඇය අවදි වන්නේ කෝපයෙනි. කෝපයෙන් අවදිවන දුර්ගා ඒ කෝපයත් සමගම පෙනී ඉන්නේ කාල යක්ෂණිය ලෙසය. ඇය ඉතා බියකරුය. එබැවින් ගනේෂගේ උත්සාහයෙන් සිදුවන්නේ අයහපතකි. රාත්‍රිය දුරුකර රාත්‍රී කාලයේද ආලෝකය පැවතුණොත් ගණේෂට දුර්ගා අවදි කිරීමට සිදු නොවෙයි. සෘෂීන්ට භූත කරදර සිදු නොවෙයි. එම රාත්‍රිය දුරු කර ආලෝකයම තබා ගැනීම සංඛේතවත් කරමින් රාත්‍රියේ පහන් දැල්වීම දීපාවලියේ අරමුණකි. මෙය සමරමින් හිංදු භක්තිකයින් දීපාවලී දිනයේ රාත්‍රිය පුරා පහන් දල්වා දුර්ග දේවිය අවදිව තබා ගැනීම සිදුකරයි.

මෙම දිනය මුල් කරගනිමින් හිංදු දේව පුරාණයට අනුව තවත් සිදුවීම් රැසක් සිදුවී ඇත.

සුරාසුර යුද්ධයේදී මහ මෙර කිරි මුහුද තුළ ගිල්වා කිරිමුහුද කැළඹීම හෙවත් සමුද්‍ර මථනයේදී ධනයට හා සමෘද්ධියට අධිපති ලක්‍ෂමිය පහළ වූ බව දේව පුරාණයයි. මෙම සිදුවීම සිදුවී ඇත්තේ හිංදු ආගමට අනුව කාර්තික මාසයේ යෙදෙන අමාවක දිනයේය. ඒ අනුව ලක්‍ෂමිය ගේ ලෝ පහළ වීම සිදුවූ දිනය වශයෙන්ද ගැනේ.

තවද දේව පුරාණයට අනුව විෂ්ණු ගේ අවතාර දහස් ගණනකි. එයින් ප්‍රධාන අවතාර දසයකි. එම දස අවතාර අතර වාමන අවතාරයද එකකි. බලි නම් අසුරයා විසින් ලක්ෂ්මිය සිරකරගෙන තබා සිටි අතර විෂ්ණු වාමන අවතාරයෙන් ගොස් බලි අසුරයා පරාජය කොට ලක්ෂ්මි බේරාගත්තේය. එම සිදුවීම ද දීපාවලී දිනක සිදුවූ බව හිංදු විශ්වාසයයි.

නරක නම් කෲර අසුර රජු විසින් කාන්තාවන් දහසය දහසක් සිරකරගෙන සිටි අවස්ථාවේ විෂ්ණු දෙවිඳුන් ක්‍රිෂ්ණ නමින් ගොස් නරකාසුර පරදා එම කතුන් දහසය දහස බේරාගත්තේද දීපාවලි දිනයක බව සඳහන් වේ.

කුර වංශික දුර්යෝධක නම් කෲර පාලකයා සමඟ දාදු ක්‍රීඩාවේ යෙදී පරාජයට පත්වන පාණ්ඩව කුමාරවරු පස්දෙනා සිය බිරින්දෑවරුන් ද සමඟ වනගත වෙයි. මේ පිළිබඳව මහා භාරතය නම් වීර යුධ කාව්‍යයෙහි විස්තර වෙයි. මෙම කුමාරවරු දොළොස් වසරකට පසු වනවාසයෙන් නිදහස්ව සිය ගම්බිම් බලා එන්නේ දීපාවලී දිනයකය. පාණ්ඩවයන්ට ප්‍රියකරන හිංදුවරු එම දිනයේදී මේ අයද සමරති.

රාමායනයට අනුව රාම කුමරු රාවණා පරදා සීතා නිදහස්කරගෙන සිය සොයුරු ලක්‍ෂමණ සමඟ ආපසු සිය රාජ්‍යය වූ අයෝධ්‍යාවට පැමිණෙන්නේ කාර්තික මාසයේ අමාවක දිනකය. එදින එරට වාසීන් රාත්‍රිය පුරා පහන් දල්වා එම රාත්‍රිය දිවා කාලය මෙන් ආලෝකමත්ව තබාගත් බව කියවෙයි. රාම යනු ද විෂ්ණු දෙවිඳුගේ අවතාරයකි. හිංදු බැතිමතුන් දීපාවලී දිනයේ එයද සිහිකරති.

හිංදු රජවරුන් අතර බොහෝ ගරු සරු ලැබූ කීර්තිමත් රජෙකු වූ වික්‍රමාදිත්‍ය රජු රාජාභිෂේකය ලබන්නේ දීපාවලි දිනකය. හිංදු බැතිමතුන් එය ද මෙදිනට සමරති.

තවද ජෛන ආගමිකයින්ද මෙදින සැමරීමක් කරයි. ඒ ජෛන ආගමේ නිර්මාතෘ ලෙස සැලකෙන මහාවීර තීර්ථංකර ය. ඔහු නිර්වාණාවබෝධය ලැබුවේ දීපාවලී දිනයක බව ඔවුන් ගේ විශ්වාසයයි. ඒ විශ්වාසය පෙරදැරි කරගන ජෛන ආගමිකයින් ද මෙදිනට දීපාවලිය සමරති.

හිංදු බැතිමතුන්ගේ ප්‍රධාන ආගමික දිනයක් සේ ගැනෙන මෙදින රාත්‍රිය පුරා පහන් ආලෝකය පවත්වාගන යමින් සිය ආගමික වතාවත්වල ඔවුහු යෙදෙති.

**දැනට කාලයක සිට ශ්‍රී ලංකාවේ දැවැන්ත අර්බුධයක් වී ඇති වකුගඩු රෝගය දැන් දැන් ව්‍යප්තිය වැඩිවෙමින් පවතී. හේතුව නිශ්චිතව හඳුනාගෙන නැතත් හේතු අනුමාන කළ හැක. කෙසේ නමුත් එම රෝගයෙන් පෙළෙන පිරිස් ආරම්භයේ සිටම සිය ඇවැතුම් පැවැතුම් ආහාර පාන ගැනීමේදී සැලකිලිමත් වන්නේ නම් එම රෝගය යම් පාලනයකට යටත් කළ හැක. වකුගඩු රෝගීන් සඳහා සුදුසු ආහාර පාන පිළිබඳ අන්තර් ජාලයෙන් උපුටා ගන්නා ලද්දක් වේ.**



# වකුගඩු රෝගීන්ට සුදුසු ආහාර පාන



## වකුගඩු සහ ප්‍රෝටීන්

වකුගඩු රෝගීන්ගේ සිරුරේ පැවැත්ම පවත්වා ගෙන යාම සඳහා ප්‍රෝටීන් අත්‍යාවශ්‍යය. එහෙත් ප්‍රමාණය ඉක්මවා ප්‍රෝටීන් ශරීරගත වුවහොත් වකුගඩු තවදුරටත් හානි වීම වැළැක්විය නොහැක්කකි. එබැවින් ප්‍රෝටීන් මෙන්ම අනිකුත් පෝෂණ ද්‍රව්‍ය ද සිරුරට ලබාගත යුත්තේ පාලනයකින් යුතුවය.

වකුගඩු රෝගය අදියර 5 කින් යුක්ත බව වෛද්‍ය පැහැදිලි කිරීමයි. මෙයින් පළමුවැනි අදියරේ සිට 3 වැනි අදියර දක්වා එනම් වකුගඩු රෝගයට මුල් අවදියේ පවතින රෝගීන් හට දිනකට ප්‍රෝටීන් ග්‍රෑම් 0.75 කිලෝ ග්‍රෑමයට සිරුරේ බර අනුව ලබාගත යුතු වේ. මේ කියමන පැහැදිලි කළොත් මෙයින් අදහස් වෙන්නේ සිරුරේ බර කිලෝ 40 ක් වන අයෙක් හට දිනකට ලබා දිය යුත්තේ (0.75 වැඩි) කිරීම 40-30) ප්‍රෝටීන් ග්‍රෑම් 30 කි.

අදියර 4 හෝ අදියර 5 යනු රෝගයේ බරපතල තත්ත්වයයි. මේ අවස්ථාව වන විට රෝගියා රුධිර කාන්දුකරණය හෙවත් ඩයලයිසිස් - තත්ත්වයට හෝ නොකරන තත්ත්වයට පත්ව සිටිය හැකිය. මේ අනුව ලබාදෙන ප්‍රෝටීන ප්‍රමාණය ශරීර බර අනුව පාලනය කළ යුතුය.

රුධිර කාන්දුකරණය නොකරන රෝගීන් හට ප්‍රෝටීන් ලබා දිය යුතු ප්‍රමාණය වන්නේ දිනකට ග්‍රෑම් 0.6 කි.ග්‍රෑ දේහ බර අනුව රුධිර කාන්දුකරණය ක්‍රම දෙකකි. ඒ සාමාන්‍ය රුධිර කාන්දුකරණය සහ පරිතාණ කාන්දුකරණය යන ක්‍රම දෙකයි. විශේෂයෙන්ම රුධිර කාන්දුකරණයේදී ප්‍රෝටීන් වැඩි ප්‍රමාණයක් සිරුරෙන් ඉවත් වේ. එබැවින් වැඩිපුර ප්‍රෝටීන් ප්‍රමාණයක් රෝගියාට ලබා දිය යුතුව ඇත. නිර්දේශිත ප්‍රමාණය වන්නේ දිනකට ග්‍රෑම් 12 සිට 14 දක්වා ප්‍රමාණයකි.

## ලේ පිරිසිදු කරනා රෝගීන්

මේ අයට දිනකට ග්‍රෑම් 12-13 අතර ප්‍රමාණයක් දේහ බර අනුව ප්‍රෝටීන් ලබාදිය යුතුය. වකුගඩු රෝගයේ තිබෙන තවත් ගැටලුකාරී තත්ත්වයක් වන්නේ ප්‍රෝටීන් වැඩිපුර ලබා දීමේදී වකුගඩුවලට හානි සිදුවන අතර ප්‍රෝටීන් අඩුවීමේදී සිරුරේ තිබෙන මාංශ පේශි දියවී රෝගියා දුර්වල වීමට ලක්වීමයි. එවිට ප්‍රතිශක්තිකරණය ද අඩුවේ. මේ හේතුව නිසා වෙනත් රෝග වැළඳීමට ද ඉඩ ඇත.

වකුගඩු අදියර 4-5 සිටින රෝගීන්ගේ පොටෑසියම් අධික ආහාර සීමා කිරීම

මුල් අවස්ථාවේ අදියර 1-3 දක්වා සමහර රෝගීන්ගේ ආහාර පාලනය කළ යුතුය.

## පොස්පරස් පාලනය කිරීම

සංතෘප්ත මේදය සීමා කිරීම - ලුණු ප්‍රමාණය අවම කිරීම. ලුණු දිනකට නිර්දේශිත ප්‍රමාණය නොඉක්මවීම.

ජලය නිසි ප්‍රමාණයට පානය කිරීම හා පානීය ජලයට අමතරව පාන වර්ගවලින් සිරුරට එකතු වන ජලය පිළිබඳ සැලකිලිමත් වීම.

පොටෑසියම් යනු ජලයේ දියවන ලවණයකි. එබැවින් පොටෑසියම් බහුල ආහාර අනුභව කිරීමේදී එළවළු කුඩා කැබලිවලට කපා දස ගුණයක් පමණ ජලය දමා පැය 2 ක් පමණ කාලයක් තැබිය යුතුය. පොටෑසියම් ජලයේ දියවන බැවින් මෙලෙස කිරීමේදී පොටෑසියම් ප්‍රමාණය දිය වී යයි. පොටෑසියම් වැඩියෙන් පවතින එළවළු වේ නම් කුඩා කැබලිවලට කපා මිනිත්තු 5-10 පමණ වේලාවක් තම්බා වතුර පෙරා ඉවත් කර ආහාරයට ගත හැකිය.

## පොටෑසියම් අඩු එළවළු වර්ග

ගෝවා, ගෝවා මල්, කැකිරි, පිපිඤ්ඤා, රවුම්



වම්බටු, බෝංචි, රතුළූණු, සුදුළූණු පතෝල, වැටකොළු, ඇඹරැල්ලා (අමුවෙන් හොඳ නැත) පිසින ලද ඇඹරැල්ලා, කැරට් (අමුවෙන් හොඳ නැත) පිසින ලද කැරට්.

## පොටෑසියම් අඩු පලතුරු

කොළ පැහැති ඇපල්, පෙයාස්, කිලෝ පේර, මිදි ගෙඩි 3 ක් දිනකට අන්නාසි කෑල්ලක් දිනකට වෙළඳපොළේ මිලදී ගත හැකි ඇපල් යුෂ හොඳ නැත. නමුත් නැවුම්ව නිවසේදී පිළියෙල කර ගන්නා ඇපල් යුෂ භාවිතය හොඳයි.

## පොටෑසියම් බහුල පලතුරු

පැපොල් කෙසෙල් අඹ, රටඉඳි, අල බතල, අලු කෙසෙල්, නිවිති, තක්කාලි, වට්ටක්කා ආදියේ පොටෑසියම් වැඩි බැවින් ඒවා අගුණ වේ.

## පලා වර්ග

පලා වර්ග වල පොටෑසියම් බහුලව තිබෙන බැවින් රෝගීන්ට පලා වර්ග සුදුසු නොවේ.

## පොස්පරස්

රෝගීන්ගේ සිරුරේ පොස්පරස් ප්‍රමාණය වැඩි වූ විට රුධිරයේ පොස්පරස් ප්‍රමාණය වැඩි වී කැල්සියම් වැඩි වීම නිසා කැල්සියම් හෘද වස්තුවේ සහ වකුගඩුවල තැන්පත් විය හැකිය.

පොස්පරස්, ඕගනික් සහ ඉන්ඕගනික් යනුවෙන් වර්ග දෙකකට අයත් වේ. විශේෂයෙන් පළතුරු යුෂ කල් තබා පවත්වා ගැනීමට කල්තබා ගැනීමේ ද්‍රව්‍යය යොදා තිබේ. විශේෂයෙන් මෙවැනි කල් පවත්නා යුෂවල ඉන්ඕගනික් පොස්පරස් අඩංගුව ඇත. මේවා පානය කිරීමේ අවාසිය වන්නේ ලේ වලට පොස්පරස් 90% ක්ම උරා ගැනීමයි. තවද ධාන්‍ය වර්ගවල නිවුඩ්ඩ සහිත හාල්වල ද පොස්පරස් ප්‍රමාණයක් ඇත. නමුත් නිවුඩ්ඩ සහිත හාල් අනුභව කළ විට ඉන්ඕගනික් පොස්රස් රුධිරයට උරා ගන්නේ 40% - 60% දක්වා පමණි. වකුගඩු රෝගීන් ආහාරයට ගත යුත්තේ තම්බපු හාල්ය. හාල් තැම්බූ විට පොස්පරස් කොටස් ඉවත් වේ.

සොයා මීට්, සොසේජස්, මීට් බෝල්ස්, හතු වර්ග, කෙරන්බීෆ්, කුනිස්සෝ, ඉස්සෝ, දැල්ලෝ, කකුළුවන් ආදියේ පොස්පරස් ප්‍රමාණය වැඩි බැවින් ආහාරයට නුසුදුසුය.

බියර් සහ සියලුම මත්පැන් වල පොස්පරස් අඩංගු බැවින් භාවිතය සුදුසු නොවේ.

# ආකර්ශණීය මුදලකට ගුවන් ටිකට්පත් මිලදී ගත හැක.



ඩුබායි කටාර් කුවේට් ඕමාන්

සවුදි ලන්ඩන් පැරිස් කැනඩා

ඕස්ට්‍රේලියා මාලදිවයින ඉතාලි ජපානය

## ඇතුළු ලොව ඕනෑම රටකට ගමන් කිරීම සඳහා...


## වැඩි විස්තර සඳහා අමතන්න...

සීමිත සිලෝන් ෂිපිං ලයින්ස් සමාගම,
450, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.
දුරකථන : 011-2689500-8

M - 077-2672970
077-3572835
077-3561210
E - csltravels@sltnet.lk

CSL TRAVELS

IATA ACCREDITED AGENT



# කොමර්ෂල් බැංකුව ක්‍රෙඩිට් කාඩ්පත් ඉලෙක්ට්‍රොනික වාර්තා ප්‍රවර්ධනය වෙනුවෙන් ස්වයං ලියාපදිංචිය සක්‍රීය කරයි.

කොමර්ෂල් බැංකුවේ ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන්ට තම මාසික වාර්තා තැපැල් මගින් පැමිණෙන තුරු බලා නොසිට බැංකුවේ වෙබ් අඩවියේ ස්වයං ලියාපදිංචි වීම මගින් එම වාර්තා ඉලෙක්ට්‍රොනිකව ලබාගත හැකි බව බැංකුව සඳහන් කරයි.

දැනටමත් ආසන්න වශයෙන් බැංකුවේ ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන්ගෙන් 45% ක් පමණ ඉලෙක්ට්‍රොනික වාර්තා තෝරාගෙන තිබෙන බවත් හඳුන්වාදී තිබෙන ස්වයං ලියාපදිංචි වීමේ ක්‍රමය තුළින් මෙම ප්‍රතිශතය තවදුරටත් වර්ධනය වනු ඇතැයි විශ්වාස කරන බව බැංකුව සඳහන් කරයි.

මේ ආකාරයෙන් ගනුදෙනුකරුවන් කැපී පෙනෙන ලෙස ඉලෙක්ට්‍රොනික වාර්තා වලට යොමුවීම වර්ධනය වීම එම ගනුදෙනුකරුවන්ට පහසුවක් මෙන්ම බැංකුවේ කඩදාසි භාවිතය අඩුකරමින් පරිසරය රැකගැනීමට බැංකුව ක්‍රියාත්මක කරන වැඩසටහන් වලට සහයෝගයක් වන බව බැංකුව සඳහන් කරයි.

කොමර්ෂල් බැංකුව හඳුන්වා දී තිබෙන ස්වයං ලියාපදිංචි වීමේ පහසුකමෙන් ප්‍රතිලාභ ලබාගැනීම සඳහා ක්‍රෙඩිට් කාඩ්පත් හිමියන් කළ යුත්තේ බැංකුවේ වෙබ් අඩවියට පිවිස ස්වයං ලියාපදිංචිවීමේ කොටසට පිවිස 'e-statements only' යන්න තෝරා ගැනීම පමණි. මේ ආකාරයෙන් ගනුදෙනුකරුවන් සාර්ථකව ලියාපදිංචි වූ පසුව ඒ පිළිබඳව ඊ-මේල් පණිවුඩයකින් දැනුම් දෙන අතර ඊළඟ මාසයේ සිට ක්‍රෙඩිට් කාඩ් බිල්පත ඉලෙක්ට්‍රොනික වාර්තාවක් ලෙස ලබාගැනීමේ අවස්ථාව හිමිවේ. මෙම ලියාපදිංචි වීමේ ක්‍රියාවලිය OTP (one time password) තුළින් ආරක්ෂිත කර තිබෙන අතර එහි අරමුණ වන්නේ දත්ත ආරක්ෂණය සිදුකිරීමයි. මේ නිසා, මෙම පහසුකම සක්‍රීය කර ගැනීම සඳහා ගනුදෙනුකරුවන්ට බැංකු ශාඛාවකට යායුතු නොවේ.

# කුළුබඩු අපනයන ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය සුවිශේෂී මූල්‍ය විසඳුම් නිර්මාණය කිරීමට මහජන බැංකුව හා SAPPTA අතර සාකච්ඡාවක්





මෙම සාකච්ඡාව මෑතකදී කොළඹ වාණිජ මණ්ඩල ශාලාවේ පැවැත්වූ අතර, එයට කුළුබඩු සහ ඊට සමගාමී නිපැයුම් නිෂ්පාදකයින්ගේ සංගමයේ (SAPPTA) සභාපති රොමේෂ් ජයසූරිය මහතා, සංගමයේ වෙනත් නිලධාරීන්, මහජන බැංකුවේ සභාපති සුජීව රාජපක්ෂ සහ ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී රංජිත් කොඩිතුවක්කු යන මහත්වරුන්, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිනි (ව්‍යවසායකත්ව බැංකු කටයුතු) ක්‍රිශානී නාරංගොඩ සහ සහකාර සාමාන්‍යාධිකාරී (කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය) වික්‍රම නාරායන මහතා සහභාගී විය.

ස්වයංපෝෂිත ආර්ථිකයක් කරා රට රැගෙන යාමේ රජයේ සංකල්පයට සහයෝගය දැක්වීමේ අරමුණින් මහජන බැංකුව විසින් කෘෂි කර්මාන්ත, ධීවර කර්මාන්ත, පශු සම්පත් කළමනාකරණය, කුඩා හාල් මෝල්, උයන් වතු වැවීම, කිරි නිෂ්පාදන සහ අනෙකුත් දේශීය කර්මාන්ත නඟා සිටුවීම උදෙසා 'අස්වැන්න' නමින් ණය යෝජනා ක්‍රමය රටට හඳුන්වා දුන්නේය. අතිග රු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයේ මඟ පෙන්වීම යටතේ ශ්‍රී ලංකා රජය විසින් ශ්‍රී ලාංකික කුළුබඩු අපනයන කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම උදෙසා ප්‍රමුඛතාවය ලබාදීමට කටයුතු කළ අතර, මේ හරහා රටේ කෘෂි කාර්මික ක්ෂේත්‍රය ගොඩනංවමින් රටට අවශ්‍ය විදේශ විනිමය උපයාග ැනීමට දේශීය කර්මාන්ත නඟා සිටුවීමට අපේක්ෂා කරයි.

අස්වැන්න ණය යෝජනා ක්‍රමයට කෘෂි කාර්මික ක්ෂේත්‍රයෙන් ලැබුණු ධනාත්මක ප්‍රතිචාර නිසා අනෙකුත් කෘෂි ක්ෂේත්‍රයන් සමඟ ද උපාය මාර්ග ික සහසම්බන්ධතාවයන් ඇතිකරගනිමින් මෙම ව්‍යාපෘතිය සමස්ත කෘෂි කාර්මික ක්ෂේත්‍රයන්ට අවශ්‍ය මූල්‍ය විසඳුම් ලබාදෙන මූලාශ්‍රය ලෙස වඩාත් පුළුල්ව ක්‍රියාත්මක කිරීමට මහජන බැංකුව අපේක්ෂා කරයි. කුළුබඩු නිෂ්පාදන ක්ෂේත්‍රය ගත්කළ කුඩා ගොවීන්, කුළුබඩු එකතුකරන්නන්, නිපැයුම් ක්‍රියාවලියට දායකත්වය දක්වන්නන් සහ අපනයනය කරන්නන් ආදී වූ එම ක්ෂේත්‍රයේ නියුතු සියලුදෙනා වෙත අවශ්‍ය නිවැරදි මූල්‍ය විසඳුම් ලබාදෙමින් ඔවුන් බලගැන්වීම හරහා රටට ඵලදායී සේවාවක් ලබාදීම මෙහි අවසාන අරමුණයි.

සාකච්ඡාව අතරතුර දී SAPPTA නියෝජිතයන් වෙත මහජන බැංකුව වෙතින් ලැබෙන සියලු මූල්‍ය විසඳුම් ක්‍රමවේදයන් පිළිබඳව පැහැදිලි පරිපූර්ණ කරුණු දැක්වීමක් එම බැංකුවේ නියෝජිතයන් විසින් සිදුකළ අතර, SAPPTA නියෝජිතයන් විසින් කුළුබඩු නිෂ්පාදන ක්ෂේත්‍රයේ මුල සිට අගට නිපැයුම් ක්‍රියාවලිදාමය පිළිබඳව පැහැදිලි චිත්‍රයක් මහජන බැංකු නිලධාරීන් වෙත ගෙන හැර දැක්වීය. මෙහිදී විවිධ කුළුබඩු වර්ග ජාත්‍යන්තර වශයෙන් වැඩි දුරටත් ප්‍රවර්ධනය කිරීම තුළින් ඉහළ විදේශ විනිමය ප්‍රමාණයක් රට තුළට ගෙන ඒමේ හැකියාව හඳුනාගත් දෙපාර්ශවය ගම්මිරිස් අපනයනය සංවර්ධනය කිරීම වෙනුවෙන් අවශ්‍ය මූලික ක්‍රමවේදයන් වේගවත් කිරීමට එකඟතාවයක් ඇති කරගත්තේය. මෙම සාකච්ඡාවෙන් පසු ජාත්‍යන්තර තරඟකාරී මිල ගණන් සහතිකවන පරිදි නිෂ්පාදනය සිදුකිරීමට සහ නිෂ්පාදන තත්වය ඉහළ නැංවීම සඳහා කුළුබඩු ක්ෂේත්‍රයේ නිපැයුම් ක්‍රියාවලි දාමයේ සියලු පියවරයන් සඳහා අවශ්‍ය නිවැරදි මූල්‍ය විසඳුම් නිර්මාණය කරදීමට මහජන බැංකුව අපේක්ෂා කරයි. මීට අමතරව ජාත්‍යන්තරයට අපනයනය කිරීමේ ශක්‍යතාවය ඇති අනෙකුත් කෘෂි නිෂ්පාදන වෙත ද තමන්ගේ මූල්‍ය විසඳුම් ලබාදීමේ ක්‍රියාවලිය ව්‍යාප්ත කිරීමට බැංකුව කටයුතු කරයි. සාම්ප්‍රදායික මූල්‍ය ක්‍රමවේදයන් අතික්‍රමණය කරමින් නව්‍ය මූල්‍ය විසඳුම් හඳුන්වා“ම හරහා ණය ඉල්ලුම් කරන්නන් වෙත තමන්ට අවශ්‍ය ණය මුදල් නම්‍යශීලීව සහ වඩාත් පහසුවෙන් ලබාගැනීමේ අවකාශය නිර්මාණය කිරීමට මහජන බැංකුව ඇපකැපවී ක්‍රියාකරයි.

සීමිත සිලෝන් ෂිපිං ලයින්ස් සමාගම
சிலோன் ஷிப்பிங் லைன்ஸ் லிமிட்டட்
Ceylon Shipping Lines Ltd.

අංක 450, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10, ශ්‍රී ලංකාව.
දුරකථන : +94 11 2689500-508
ෆැක්ස් : +94 11 2689510/2674347
ඊ මේල් : csl123@sltnet.lk
අන්තර්ජාලය : www. ceylonshippinlines.com

இல: 450, டீ. ஆர். விஜேவர்தன மாவத்தை,
கொழும்பு 10, இலங்கை.
தொலைலபேசி : 0094 11 2689500-508
தொலைநகல் : 0094 11 2689510, 2674347
மின்னஞ்சல் : csl123@sltnet.lk
இணையம் : www.ceylonshippinglines.com

450, D.R. Wijewardena Mawatha,
Colombo 10, Sri Lanka.
Tel : 2689500-508 Fax : 2689510/2674347
E-mail : csl123@sltnet.lk
Web: www.ceylonshippinglines.com

ප්‍රධාන නිෂ්කාශන මධ්‍යස්ථානය
කොළඹ / கொழும்பு / Colombo

අංක. 760, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 09, ශ්‍රී ලංකාව.
දුරකථනය : +94 11 268-0301-5
ෆැක්ස් : +94 11 2680309/10
ඊ-මේල් : cslupb@sltnet.lk

இல. 760, டொக்டர் டெனிஸ்டர் தி சில்வா மாவத்த,
கொழும்பு 09, ஸ்ரீ லங்கா.
தெலைபேசி : +94 11 268-0301-5
தொலைநகல் : +94 11 2680309/10
மின்னஞ்சல் : cslupb@sltnet.lk

760, Dr. Danister De Silva Mawatha,
Colombo 09, Sri Lanka.
Tel: +94 11 2680301-5 Fax: +94 11 2680309/10
Email: cslupb@sltnet.lk

නිෂ්කාශන මධ්‍යස්ථානය
මහනුවර / கண்டி / Kandy

අංක 175, පරණ ගංතොට පාර,
මාවිල්මඩ, මහනුවර.
දුරකථන : +94 81 2234356-57, +94 81 4471935
ෆැක්ස් : +94 81 2234360

இல. 175, பழைய கங்தொட வீதி,
மாவில்மட, கண்டி.
தெலைபேசி : 0094 812234356-57,0094 814471935
தொலைநகல் : 0094 812234360

175, Paranagantota Road,
Mawilmada, Kandy.
Tel : +94 81 2234356-57, +94 81 4471935
Fax : +94 81 2234360

නිෂ්කාශන මධ්‍යස්ථානය
මඩකලපුව /மட்டகழப்பு / Batticaloa

අංක: 134, මහා වීදිය, අඩලච්චේනෙයි 09.
දුරකථන/ෆැක්ස් : +94 67 2277302
ජංගම : +94 774503759

இல. 134 பிரதான வீதி, அட்டாளைச்சேனை 09.
தெலைசே-பெக்ஸ் : 0094(0)67 2277302
கைத்தொலைபேசி : 0094 774503759

No. 134, Main Street, Addlaichchenai 09.
Tel/Fax : +94 67 2277302
Mobile : +94 774503759


Opportunity to send your
Christmas and new Year gifts
to your loved ones
on this Festival Season
By courier'
With in 6-7 days
Special Rates
Till 31/12/2020
to
UK, Australia, France, USA, Italy, Japan
(Special rates opply for over 5kg / 10kg shipments)
Door delivery
Free Boxes for Packing
Attractive rates for over 50kg shipment
For Further information please contact
Pujitha Liyanage on 0777224624
Shipping Department,
Ceylon Shiipping Lines Limited,
450, D.R. Wijewardana Mw,
Colombo 10.
Tel - 0112689500 - 508 Email - cslship@sltnet.lk

# සීමිත සිලෝන් ෂිපිං ලයින්ස් සමාගම
## சிலோன் ஷிப்பிங் லைன்ஸ் லிமிட்டட்
## Ceylon Shipping Lines Ltd

**ඔබේ භාණ්ඩ මව් රට ගෙන ඒමට ලොව පුරා සිටින අපගේ නියෝජිත මහතුන් හමුවන්න.**

### ඔස්ට්‍රේලියාව/அவுஸ்திரேலியா/Australia

සී. එස්. එල්. ඔස්ට්‍රේලියා
சி. எஸ். எல். அவுஸ்திரேலியா
**C. S. L. Australia**
10/2, Dingley Ave Dandenong,
Victoria 3175, Australia.
✆ +61397929877/0061 396023966
Fax: +61397924655
✉ cargo@skyway.com.au/www.skyway.com.au

### ජපානය / ஜப்பான் / Japan

ජූරියා ඉන්ටර්නැෂනල්
ஜுரியா இன்டர்நெஷனல்
**Juria International**
✆ +81283205383
Fax: +81283205384
Mobile - 0081-(90) 31027600
✉ tea@cronos.ocn.ne.jp
tcperera@ymail.com / csl@juriaweb.com

### සිංගප්පූරුව / சிங்கப்பூர் / Singapore

එම් ඇන්ඩ් එස් එක්ස්ප්‍රස් කාර්ගෝ ලොජිස්ටික්ස්
எம் என்ட் எஸ் எக்ஸ்பிரஸ் கார்கோ லொஜிஸ்டிக் (பிரை)லிமிட்.
**M & S Express Cargo Logistics Pte. Ltd.**
No. 23, Daihousie Lane, Singapore - 209688
✆ +6563966614 / +6563966615
Fax: +6563966621
✉ sales@ms5.com.sg / mifras@ms5.com.sg

### දෝහා - කටාර් / தோஹா - கட்டார் / Doha - Qatar

ලාන්ස් ග්ලෝබල් ලොජිස්ටික්ස්
லான்ஸ் க்ளோபல் லொஜிஸ்டிக்ஸ்
**Lans Global Logistics**
PO Box - 31534, Al - Corniche Tower
Doha - Qatar.
✆ +974 40 414141
Fax: +974 40 414199
Mobile +974 40 414141 / 077 3601554
✉ cmb@lanslogistics.com

ගල්ෆ් ෆැල්කන් සර්විසස් කම්පනි (W.L.L.)
கல்வ் வெல்கன் சேர்வீசஸ் கம்பனி
**Gulf Falcon Services Company (W.L.L.)**
PO Box - 7079, Doha - Qatar.
✆ +974 44869723
Fax: +974 77885503 / +974 77883866
✉ gulffalconcargoqatar@gmail.com

### මැලේසියාව / மலேசியா / Malaysia

ජයලංකා / ஜயலங்கா
**Jayalanka (M) SDN BHD**
No. 32 - 2 Jalan
14/48 A, Sentul Raya 51000
Kualalampur, Malaysia
✆ 603-40421896 / +966 539222031
00966 532480407
✉ jay_langka@yahoo.com

### කුවේට් / குவைத் / Kuwait

ෆැල්කන් කාගෝ / பெல்கன் கார்கோ
**Falcon Cargo**
2952, Safat 13154, Kuwait
✆ 0096522419095, 0096522457315
Fax: 0096522419098
✉ falconcargo@hotmail.com
falcon_cargo@hotmail.com

යුනයිටඩ් එක්ස්ප්‍රස් ලොජිස්ටික්
யுனைட்டட் எக்ஸ்பிரஸ் லொஜிஸ்டிக்
**United Express Logistic**
Office No 26, Qasariya Blg - 2,
Fahaheel, Kuwait
✆ +9652495858/+9652470862/+96522495898
✉ info@unitedexpresslogistics.com

### ඩුබායි යූ ඒ ඊ / டுபாய் யு. ஏ. ஈ. / Dubai U A E

එම්බසි ෂිපිං ඇන්ඩ් ෆ්‍රේට් එල් එල් සී
எம்பசி ஷிப்பிங் என்ட் பிரைட் எல். எல். சீ
**Embassy Shipping & Frieght LLC**
P.O. Box. 32863, Al Aweer, Dubai, UAE.
✆ Toll Free - 800 37 30
Hot Line - 055 244 99 66
Tel: +971 4 320 70 70
Fax: +971 4 320 71 71
✉ info@embassyshipping.com
www.embassyshipping.com

නිර්මාන කාගෝ ඇන්ඩ් ලොජිස්ටික් සර්විස් /
நிர்மான கார்கோ / **Nirmana Cargo and Logistic Service**
PO Box 87556, Dubai, U.A.E.
✆ +971 556000826

හිරු කාගෝ / இரு கார்கோ / **Hiru Cargo**
PO Box 15946,
Dubai
✆ +971 42895750
✉ hirumooncargo@gmail.com

මදර්ලයින් ෂිපිං / மதர்லயின் ஷிப்பிங் /
**Motherline Shipping**
PO Box 44806,
205 Second Floor,
Zainal Mohebi Plaza Building,
Opp. Centre Point, Dubai
✆ +971 42868791
✉ ravi@motherlines.com

ඕෂන් ලංකා කාගෝ
ஓசியன் லங்கா கார்கோ
**Ocean Lanka Cargo**
P.O. Box - 48843,
Dubai - UAE
✆ 00971-04-2640054
Mobile - 00971-0555 491 987
✉ oceanlankacargolk@gmail.com

ලක්බිම කාගෝ / லக்பிம கார்கோ
**Lakbima Cargo**
P.O. Box - 22675,
Ajman, UAE.
✆ +971 6 7480522

### බහරේන් / பஹறைன் / Bahrain

කලම්බු කාගෝ කම්පැනි
கொழும்பு கார்கோ கொம்பனி
**Colombo Cargo Company**
Bahrain
Block 321, 338, Building No 177
Manama / Alaudayiyah,
Kingdom of Bahrain.
✆ +973 35939343
Fax: +973 17 811707
✉ colombosuppliersbhn@gmail.com

### සවුදි අරාබිය / சவுதி அரேபியா / Saudi Arabia

#### Jeddah

වර්ල්ඩ් වයිඩ් ෆ්‍රේට් / வேல்ட் வைட் பிரைட்
**World Wide Freight**
World Wide Link,
(A Div. Of Khalid Nazer Ahames Al Gahathani Trading Est) Jeddah, K.S.A.
✆ 0505657412/0500773931/0543902880
+96626350650/+96626476087/026350650
✉ imthiyaz85360@yahoo.ca

#### දමාම් / Dammam / தமாம்

ඒ බී ටී කාර්ගෝ සර්විස් / ஏ.பி.டி. கார்கோ
**ABT Cargo Services**
✆ +966550952031

#### රියාද් - ரியாத் - Riyadh

ඒ බී ටී කාර්ගෝ සර්විස් / ஏ.பி.டி. கார்கோ
**ABT Cargo Services**
Riyadh Office: +966 112700055
✆ +966555892754
+966532083640
✉ abtcargo2016@gmail.com

ෆේම් කාගෝ / பேம் கார்கோ / **Fame Cargo**
P.O. Box 17958, Riyadh 11494
✆ 2442032/4793845/0508273719
Fax: 4793845 / 00966 - 583090555
✉ fameruhcmb@gmail.com

### ලෙබනන් / லெபனான் / Lebanan

ජිහාඩ් රොක්ස් ෂිපිං ඇන්ඩ් ට්‍රේඩිං
ஜிஹாட் ரொக்ஸ் சிப்பிங் அன்ட் ரேடிங்
**Jihad Roukz Shipping & Trading**
JRC, Chbenieh Baadba, Beirut, Lebanon
✆ 00961 - 254733 / 00961 - 3773244
Fax: 0096111242677
✉ lanka _cargo@hotmail.com

### ස්විට්සර්ලන්තය / சுவிட்சர்லாந்து / Switzerland

එම් සී එස් කාගෝ / எம் சீ எஸ் கார்கோ
**M C S Cargo**
M.T. & T Gmbh, Sperietweg 1, 8052
Zurich, Switzerland.
✆ 0041-796656563 / 0041- 443025838
✉ mcscargo@swissmail.com

### කැනඩාව / கனடா / Canada

සීකැන් ට්‍රාන්ස්කොන්ටිනන්ටල්
சீகேன் ட்ரான்ஸ்கொன்டினன்டல்
**Ceycan Transcontinental**
1981, Boylen Road,
Unit # 5, Mississawga, Ontairo,
L5slR9
✆ +9056739873
Fax: +9056739905
✉ cslcanada2001@gmail.com
ceycantrans@gmail.com

### එංගලන්තය / இங்கிலாந்து / United Kingdom

ජේ පී එන් ෂිපිං / ஜே பி என் சிபிங்
**JPN Shipping**
Unit A2c, Redlands
Coulsdon cR5 2HT wk
✆ 02086680252
✉ info@jpnshippingltd.co.uk

මාස් ග්ලෝබල් ෂිපිං
மாஸ் குளோபல் ஷிப்பிங்
**Mass Global Shipping**
✆ 044(0)208 4221232
Fax: 208 8644244
✉ info@masshipping.com

ඊසි ෂිපිං ලිමිටඩ් / ஈஸி ஷிப்பிங் லிமிட்டட்
**Easy Shipping Ltd.**
Unit 15, Liongate Enterprise Park
80, Moden Rd, Mitcham cR4 N4
✆ 02086489092 / 07908787627
Fax: info@easyshippingltd.co.uk
www.easyshippingltd.co.uk

ඇට්ලස් ෂිපිං / அட்லஸ் ஷிப்பிங்
**Atlas Shipping**
430, High Road, Willesden,
London. NW 10 2HA
✆ 02084596633 / 0794743535
✉ ajantha.atlasshipping@gmail.com

### ඇමරිකාව /அமெரிக்கா /America

කලම්බු එක්ස්ප්‍රස් / கொழும்பு எக்ஸ்பிரஸ்
**Colombo Express**
1115, Inman Ave, Suite - 323
Edison NJ - 08820
✆ 1888 232 1952
✉ nishan@colomboexpress.com
www.colomboexpress.com


Ceylon Shipping Lines Ltd
450, D.R. Wijewardena Mawatha,
P.O. Box 891, Colombo 10, Sri Lanka.
Tel: (011) 2689500-508, 2680311-315
Fax: (011) 2689510, 2674347
E-mail: csl123@sltnet.lk
cslmgmt@sltnet.lk
Web: www.ceylonshippinglines.com
Contact: Neranjan - 0777224617
Ceylon Shipping Lines Ltd.
SLSI
SYSTEM CERTIFIED
ISO 9001
MGMT. SYS.
RvA C 155
PATA
Pacific Asia Travel Association
IATA
TAASL
Serving with Excellence
♦ Customs Bonded Warehousing
♦ Unaccompanied Personal Baggage Clearing & Door to Door Home Delivery Covering Major Cities in Sri Lanka Connecting with Worldwide Destinations
♦ Managing Processing, Shipping Forwarding & Distribution of Imports & Exports
♦ Airline Ticketing & Travel Agency
♦ City Central Container Depot Freight Station & Island wide Transportation
♦ Printing & Publishing